# දේව බලය



නොමිලේ -
විකිණීමට නොව

සම්පාදනය:
වොට්සන් ගුඩ්මන්

# දේව බලය

අප මැවුම්කරුගේ බලය, නැතහොත් සියල්ල කෙරෙහි ඇති අප දෙවියන් වහන්සේගේ සර්ව බලපූර්ණවන්කම, සීමිත, තාවකාලික පුද්ගලයන් වන අප කෙසේ විස්තර කරන්නද? දෙවියන්වහන්සේ ඉතා බලවත්, උතුම් හා අති විශාල බැවින් සෑහෙන තරමින් හෝ එය කිරීමට බැරි වනුයේ, අප කුඩා මනසට ඒ සියල්ල වටහාගැනීමට නුපුළුවන් නිසාය.

මිනිසාට නොහැකියි සිතන ඕනෑමදෙයක් කිරීමෙහි සමත් දේව බලය ගැන, සෑහෙන, විශාල, අවබෝදයක් දීමෙහි ලා, උන්වහන්සේගේ පොත වන බයිබලය තුළින් දෙවියන්වහන්සේ එළිදරව් වී ඇත! අප ලොව මැවූ උන්වහන්සේ එය අහස් කුස එල්ලූහ. මෙසේ, අවුරුදු දහස් ගණනක් මුළුල්ලේ, මෙය, දෙවියන්වහන්සේගේ ඉසිලීමේ බලය මත මිස, වෙන කිසිවෙක එල්ලී නැත. සාතන් හා මිනිසාගේ විනාශකාරි බල කොපමණ තිබුණත්, උන්වහන්සේ අප පොළොව සාරවත් කරති.

දෙවියන්වහන්සේගේ නොනැසෙන, අසීමිත බලය ගැන උන්වහන්සේගේ එළිදරව් කිරීම දැනගැනීම පිණිස දැන් අපි දේව වචනයට නෙත් යොමු කරමු.

වොට්සන් ගුඩ්මන්

# මැවීමට ඇති දේව බලය

යෙරෙමියා 10 : 12

උන්වහන්සේ සිය බලයෙන් පොළොව මැවූහ; සිය ප්‍රඥාවෙන් ලොව පිහිටා, සිය ඥානයෙන් අහස විහිදූහ.

යෙසායා 40 : 18 අ, 22, 25, 26

ඔබලා දෙවියන්වහන්සේව සමාන කරන්නේ කා හටද?... පෘථිවි චක්‍රය මත වැඩ සිටින්නේ උන්වහන්සේය; එහි වැසියන් පළඟැටියන් මෙන්ය; ඇතිරිල්ලක් සේ අහස විහිද, වාසය කිරීමට කූඩාරමක් සේ එය අතුරා තිබේ... ඉතින් ඔබලා, කා හට, මා සමාන කරත්ද? මා කා හට සමානව සිටීදැයි ශුද්ධ තැනන්වහන්සේ අසති. ඔබලාගේ නෙත් ඉහළට ඔසවා බලන්න. මේවා මැවූවේත්, එහි සේනාව ගණන් වශයෙන් පිටත පමුණුවන්නෙත් කවුද? උන්වහන්සේ ඒ සියල්ලට, නම් කියා අඬගසති; උන්වහන්සේගේ බලයේ මහත්කම නිසාද, උන්වහන්සේ ශක්තියෙන් බලවත් නිසාද, ඒ එකක්වත් නැවිත් නොසිටෙයි.

යෙරෙමියා 32 : 17

අහෝ, ස්වාමිවූ දෙවියන්වහන්ස, ඔබගේ මහත් බලයෙන්ද, දිගු කළ ඔබගේ හස්තයෙන්ද, ඔබ අහසත්, පොළොවත් මැවූසේක; ඔබට නුපුළුවන් කිසිත් නැත.

හෙබ්‍රෙව් 1 : 1 අ, 2

දෙවියන්වහන්සේ...මෙදවස් අවසානයේ දී, සිය පුත්‍රයා තුළින් අපට කථා කළහ. උන්වහන්සේව සියල්ලට උරුමක්කරු කළසේක; උන්වහන්සේ තුළින් ලෝක සෑදූහ.

# ග්‍රහ ලොවක් මවා එය අහසේ එල්ලීමට සාතන්ට තුඩුළුවන

යොහන් 1 : 1, 3; 10 : 10අ

පටන්ගැන්මේ දී වාක්‍යාණෝ සිටිසේක; වාක්‍යාණෝ දෙවියන්වහන්සේ සමග සිටිසේක; වාක්‍යාණෝ දෙවියන්වහන්සේව සිටිසේක... උන්වහන්සේ විසින් සියල්ල සාදන ලදි; සාදන ලද කිසිත්, උන්වහන්සේ නොමැතිව සාදන නොලදි... සොරා එන්නේ සොරකම් කිරීමටත්, මැරීමටත්, විනාශ කිරීමටත් පමණක්ය.

ලූක් 10 : 18

උන්වහන්සේ ඔවුන්ට කියනසේක: සාතන්, විදුලිය මෙන් අහසෙන් වැටුණා මම දිටිමි.

1 පේත්‍රුස් 5 : 8

සිහි ඇතිව, අවදිව සිටින්න. ඔබලගේ එදිරිවාදියා වූ යක්ෂයා, ගොරවන සිංහයෙකු මෙන්, කවරෙකු ගිලිම්දැයි සොයමින් ඔබමොබ ඇවිදියි.

ක්‍රියා 17 : 29

දෙවියන්වහන්සේගේ දරුවන් වන අප විසින්, මිනිස් ශිල්පයෙන් හා සමර්ථකමින් කැපූ රනටවත්, රිදීයටවත්, ගලටවත්, දේවත්වය සමාන යයි සිතිය නොයුතුයි.

1 කොරින්ති 10 : 20 ආ

...ඔබලා යක්ෂයන් හා සහභාගිව සිටීමට මම අකමැත්තෙමි.

යොහන් 8 : 12

යේසුස්වහන්සේ ඔවුන්ට නැවත කථාකරමින්: මම ලෝකයේ ආලෝකයය; මා අනුව එන්නා අන්ධකාරයේ නොහැසිර, ජීවනයේ ආලෝකය ලබන්නේ යයි කීසේක.

# දේව බලයට සීමාවක් නැත



ගීතාවලිය 62 : 11

දෙවියන්වහන්සේ එක් වරක් කීසේක, මම මෙය දෙවරක් ඇසිමි; එනම්, බලය දෙවියන්වහන්සේ සතු බවය.

ගීතාවලිය 115 : 3

අපගේ දෙවියන්වහන්සේ ස්වර්ගයේය. උන්වහන්සේ කැමති කවරදෙයක් හෝ කළසේක.

යෙසායා 43 : 13 අ

එසේය, දවස පටන්ගැන්මට පෙර, මම උන්වහන්සේය. මාගේ අතින් මුදලන්ට කෙනෙක් නැත...

1 ලේකම් 29 : 11, 12 අ

**ස්වාමීන්වහන්ස**, මහත්තත්වයද, පරාක්‍රමයද, තේජසද, ජයද, මහිමයද අයිති ඔබටය. මක්නිසාද, ස්වර්ගයේ හා පොළොවේ ඇති සියල්ල ඔබගේය. **ස්වාමීන්වහන්ස**, රාජ්‍යයත් අයිති ඔබටය, ඔබ සියල්ලට හිස මෙන් උසස්ව සිටිනසේක. වස්තුවද, ගෞරවයද, පැමිණෙන්නේ ඔබගෙනි. ඔබ සියල්ල ආණ්ඩු කරති; බලයද, පරාක්‍රමයද, ඔබ සුරතේය. සියල්ලන් උසස් කිරීමටත්, ශක්තිමත් කිරීමටත් බලය, ඔබ අත ඇත.

විතීය 3 : 24

අහෝ ස්වාමී වූ **දෙවියන්වහන්ස**, ඔබ උතුම්කමද, බලවත් හස්තයද, ඔබ මෙහෙකරුට පෙන්වීමට, ඔබ පටන්ගත්තෙහ. මක්නිසාද, ඔබ ක්‍රියාවලද, ඔබ බලපරාක්‍රමයේද සැටියට කිරීමට, වෙන යම් දෙවි කෙනෙක් ස්වර්ගයේ හෝ පොළොවේ ඇත්ද?

ලූක් 1 : 37

දෙවියන්වහන්සේට කිසිවක් අසීරු නැත.

# අසීමිත දේව බලයේ උත්තම භාවය

නික්මයාම 15 : 7

ඔබගේ මහත්තත්වයේ උතුම්කමින්, ඔබට එරෙහිව නැඟී සිටින්නන්ව ඔබ පරාජය කරති. ඔබ, සිය උදහස යවනසේක. එයින් ඉපනැල්ල මෙන් ඔවුහු දැවෙති.

ගීතාවලිය 147 : 5

අප **ස්වාමින්** උතුම්ය, මහා බලයෙන් පූර්ණය; උන්වහන්සේගේ ඥානය සීමාරහිතය.

ගීතාවලිය 106 : 8

උන්වහන්සේ, සිය බලපරාක්‍රමය පෙන්වන පිණිස, ස්වකීය නාමය නිසා ඔවුන් ගැලවූසේක.

නෙහෙමියා 9 : 6

ඔබම, ඔබ පමණක්ම **ස්වාමින්ය;** ඔබ, ස්වර්ගය හා ස්වර්ගවල ස්වර්ගද, එහි සියලු සේනාවන්ද, පොළොව සහ එහි ඇති සියල්ලද, සයුරද, එහි ඇති සියල්ලද මැවූහ. ඔබම ඒ සියල්ල ආරක්ෂා කරන සේක; ස්වර්ගීය සේනාවද ඔබට නමස්කාර කරති.

ගීතාවලිය 104 : 1

මාගේ ආත්මය **ස්වාමින්ට** ප්‍රසංසා කරත්වා; මාගේ දෙවි වූ **ස්වාමිනි**, ඔබ ඉතා උතුම්ය. ඔබ ගෞරවයෙන් හා මහිමයෙන් සැරසී සිටිනසේක.

ගීතාවලිය 145 : 2, 3

සැමදින, මම ඔබට ප්‍රසංසා කරමි; සදහටම ඔබ නම වර්ණනා කරමි. **ස්වාමින්** උතුම්ය, බොහෝ සේ ප්‍රසංසා ලැබිය යුතුය. උන්වහන්සේගේ උත්තමභාවය සොයා දැනගත නොහැකිය.

# දේව බලය සදාකාලිකය 

2 පේත්‍රුස් 1 : 11

අපගේ ස්වාමි වූ, ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සදාකාල රාජ්‍යයට ඇතුලුවීම ඔබලට බොහෝ සේ දෙනු ලැබේ.

යෙසායා 26 : 4

**ස්වාමීන්** තුළ සදහටම විශ්වාස කරන්න; මක්නිසාද, **යෙහෝවා** නම් වූ **ස්වාමීන්** සදාකාල පර්වතයකි.

ගීතාවලිය 90 : 2

කඳුවල උත්පත්තියටත්, ඔබ විසින් පොළොව හා ලොව සෑදීමටත් පෙර, සදහෙන් සදහට ඔබ දෙවියන්වහන්සේය.

යෙරෙමියා 10 : 10

නුමුත් **ස්වාමීන්** සැබෑ වූ දෙවියන් වහන්සේය; උන්වහන්සේ ජීවමාන දෙවියන්වහන්සේය, සදාකාල රජෙක්ය. උන්වහන්සේගේ උදහසට පොළොව වෙව්ලන්නේය, ජාතීන්ට උන්වහන්සේගේ උදහස දරීමට නුපුළුවන.

එළිදරව් 11 : 15 ආ

...ලෝ අධිපතිකම අප ස්වාමීන් වහන්සේටද, සිය ක්‍රිස්තුස්වහන්සේටද විය. උන්වහන්සේ සදහටම රාජ්‍ය කරනසේකැයි කියන මහත් හඬවල් ස්වර්ගයේ වූහ.

**සාතන්ගේ බලය විනාශකරනු ලැබේ**

එළිදරව් 20 : 10

ඔවුන්ව මුළා කළ යක්ෂයාව... ගින්නෙන් හා ගෙන්දගම්න් යුතු විලට හෙළීය. සදහටම, දිවා රාත්‍රී දෙකෙහිම... වධකරනු ලැබේ.

# රතු මුහුදේ දී බිය එලවන දේව බලය

නික්මයාම 14:21, 22, 26-28, 30, 31අ

මෝසස්, සිය සුරත මුහුදට ඉහලින් දිගු කළේය; **ස්වාමින්ද**, ඒ මුළු රාත්‍රියෙහි, බලවත් නැගෙනහිර සුළඟක් තුළින්, මුහුද පස්සට යැමට සළසා, මුහුද ගොඩබිමක් කළහ. ජලයද බෙදී ගියේය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ, වියලි භූමිය පිට මුහුද මැදට ගියෝය. ඔවුන්ගේ දකුණත හා වමත තිබු ජලය, ඔවුන්ට තාප්පයක් සේ විය... **ස්වාමින්** මෝසස්ට කථාකර: මිසරවරුන් පිටද, ඔවුන්ගේ රථ හා අසරුවන් පිටද, නැවතත් ජලය හැරී එන පිණිස, ඔබ සුරත මුහුදට ඉහලින් දිගු කරන්නැයි කීසේක. මෝසස්, සිය සුරත මුහුදට ඉහලින් දිගු කළේය. පහන් වූ කළ, මුහුද, එහි නියම සවභාවයට හැරුණේය; මිසරවරු එය ඉදිරියට දුව ගියහ; **ස්වාමින්** මිසරවරුන්ව මුහුද මැදට හෙළා දමූසේක. ජලය හැරී ඇවිත්, රථද, අසුරුවන්ද, එසේය, ඔවුන් පසුපස ගිය පාරාවෝගේ මුළු සේනාවම වසා ගත්තේය. ඔවුන්ගෙන් එක් කෙනෙකුවත් ඉතිරි නොවීය... **ස්වාමින්** එදවස්, මිසරවරු අතින් ඉශ්‍රායෙල්වරු ගැළවූහ; මිසරවරු මුහුදු වෙරළේ මැරී සිටීම ඉශ්‍රායෙල්වරු දිටීහ. මෙසේ **ස්වාමින්වහන්සේ** මිසරවරුන්ට කළ මහත් ක්‍රියාව ඉශ්‍රායල්වරු දුටුවෝය.

# කිසිම හාස්කමක් දෙවියන්වහන්සේට ලොකු නැත

### මිනිසුන් දස ලක්ෂයකට වර්ෂ 40 කෑම දුන්හ

නික්මයාම 16 : 12 ආ-15 අ සහ 35 අ

ඔබලා, සවස මාංස කන්නේය. උදය, රොටිවලින් තෘප්තියට පැමිණෙයි; මම ඔබලාගේ දෙවි වූ **ස්වාමින්** බව ඔබලා දැනගනිති...... එලෙස, සවස වටුවෝ පැමිණ අන්දයම් වසාගත්හ. උදය කඳවුර හාත්පස පිනි තිබුණි. වැටී තිබූ ඒ පිනි හිඳුණු කල, බලව, හිම මෙන් හීන් කුඩා වට වූ දෙයක් වනාන්තරයේ පොළෝ මත තිබුණේය. ඉශ්‍රායෙල් පුත්‍රයෝ එය දැක, මේ මන්නා යයි එකිනෙකාට කීහ... ඉශ්‍රායෙල් පුත්‍රයෝ, මිනිස් පථයකට එන තෙක්, වර්ෂ හතළිහක් මන්නා කෑහ...

### දස ලක්ෂයකට වතුර

නික්මයාම 17 : 6 අ

බලව, මම හොරෙබ් හි පර්වතය පිට ඔබ ඉදිරියේ සිටිමි; පර්වතයට ඔබ තදින් ගසන්න, එවිට, සෙනඟට බීමට වතුර එයින් නික්මෙන්නේය.

### ගැලූ ගඟ නතර කළහ

යොෂුවා 3 : 17 අ

**ස්වාමින්ගේ** ගිවිසුම් පෙට්ටිය ගෙන යන පූජකයෝ, යොර්දන් මැද වියළි භූමිය මත ස්ථිරව සිටියහ... සියලු ඉශ්‍රායෙල්වරු වියළි භූමිය මත ගියෝය.

# 8 දෙවියන්වහන්සේ අති උතුම් මිදුම්කරුවෙකි

දනියෙල් 3 : 21, 22 සහ 27

එකල ඔවුහු, ඒ මිනිසුන්ව, ඔවුන්ගේ පොරෝනද, සැට්ටද, සළුද, වෙනත් වස්ත්‍රද සමග බැඳ, ඇවිලෙන ගිනි උඳුන මැදට හෙලූහ. රජුගේ ආඥාව තද නිසාත්, උඳුන ඉතා රත්ව තිබුණු නිසාත්, ශෙද්‍රැක්, මේෂැක් හා ඇබෙද්නිගෝව ඉසුලූ මිනිසුන් ගිනි දළුවලින් නැසුනාහ... දිසාපතීන්ද, අධිපතීන්ද, ආණ්ඩුකාරයන්ද, රජගේ මන්ත්‍රීවරුන්ද රැස්ව, ඒ මිනිසුන්ගේ ශරීර කෙරෙහි, ගින්න බලනොපැවත් වූ බවත්, ඔවුන්ගේ හිසකෙස් වත් නොදැවුණු බවත්, ඔවුන්ගේ පොරෝන වෙනස්වෙලා හෝ ගිනිගඳ ඔවුන්ට වැදිලා නැති බවත් දිටීහ.

දනියෙල් 6 : 16 සහ 21, 22

එවිට රජුගේ ආඥාව පිට, ඔවුහු දනියෙල් ගෙන විත් සිංහ ගුහාවේ දැමූහ. රජ දනියෙල්ට කථාකර: ඔබ නොකඩවම සේවය කරන ඔබේ දෙවියන්වහන්සේ ඔබව ගලවනසේක්වයි කීය... එවිට දනියෙල් රජට කථාකර: රජුනි, ඔබ සදහටම ජීවත් වේවා. මාගේ දෙවියන් වහන්සේ සිය දූතයා එවා, සිංහයන් මට අනතුරු නොකරන පිණිස, එවුන්ගේ කට වල් වැසූසේක. මක්නිසාද, උන්වහන්සේ ඉදිරිපිට මා තුළ නිදෙස්කම තිබුණේය; එලෙසම රජුනි, ඔබ ඉදිරියේද මම කිසි වරදක් නොකෙළෙමියි කීය.

# දේව වචනයේ බලය



යෙරෙමියා 23 : 29

මාගේ වචනය ගින්නක් මෙන්ද, පර්වතය පොඩිකරන කුළුගෙඩියක් මෙන්ද නොවේදැයි ස්වාමින්වහන්සේ කියනසේක

හෙබ්‍රෙව් 4 : 12

දෙවියන්වහන්සේගේ වචනය ජීවමානය බලවත්ය, ඕනෑම දෙමුහත් කඩුවකටත් වඩා තියුණුය, ප්‍රාණය හා ආත්මයද, සන්ධි හා ඇටමිදුළුද වෙන් කරන තරමට කා වදින්නේය; සිතේ සිතුවිලිද, අදහස්ද විමසන්නේය.

එපීස 6 : 17

ගැලවීම නැමති ආරක්ෂා හිස්වැස්මද, දේව වචනය නැමති ආත්මයාණන්ගේ කඩුවද ගන්න.

ගීතාවලිය 119 : 9

තරුණයෙක් සිය මාර්ගය පවිත්‍ර කර ගන්නේ කුමකින්ද? ඔබගේ වචනය අනුව පැවතීමෙන්ය.

යොහන් 15 : 3

මා ඔබලට කී වචනය තුළින් ඔබලා... පවිත්‍රය.

යොහන් 17 : 17

සැබෑවෙන් ඔවුන්ව පවිත්‍ර කළ මැනව, ඔබගේ වචනය සැබෑවය.

පිලිප්පි 2 : 15

...ජීවනයේ වචනය පාමින්...

යොහන් 8 : 31

තමන්ව අදහාගත් යුදෙව්වරුන්ට, යේසුස්වහන්සේ: ඔබලා මාගේ වචනයේ පවතිනවා නම්, සැබවින්ම ඔබලා මාගේ ගෝළයන් යයි කීසේක.

# යේසුස් ක්‍රිස්තුස් මාංසමත් වූ දෙවිතුමාය

කොලොස්සි 2 , 9

මක්නිසාද, උන්වහන්සේ තුළ දේවත්වයේ සියලු සම්පූර්ණකම ශරීරාකාරයෙන් වාසය කරයි.

මතෙව් 1 : 22-25

...බලව, කන්‍යාව ගැබ්ගෙන පුත්‍රයෙකු ප්‍රසූත කරයි. උන්වහන්සේට එම්මානුවෙල් යන නම තබනවා ඇත... ඒ නාමයේ අර්ථය: දෙවියන්වහන්සේ අප සමග යනුයි. එවිට යෝසප්... ඈ කුළුදුල් පුත්‍රයා ප්‍රසූත කරන තෙක්, ඇව නැදින්නේය. ඔහු, **යේසුස්** යන නම උන්වහන්සේට තැබීය.

යොහන් 5 : 17, 18

නුමුත් යේසුස්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්: මාගේ පියාණන් මේ දක්වාම ක්‍රියා කරති; මමත් ක්‍රියා කරමියි කීසේක. එබැවින්, උන්වහන්සේ සබත් කඩ කළා පමණක් නොව, දෙවියන්වහන්සේ සිය පියාණන් යයි කියමින්, තමා දෙවියන් වහන්සේ හා සමාන කරගත් නිසා යුදෙව්වරු, උන්වහන්සේව මැරීමට වඩ වඩාත් සෙවූහ.

රෝම 1 : 5

...ශුද්ධත්වයේ ආත්මයේ ලෙසට මළවුන්ගෙන් නැගිටීම තුළින් බලයෙන් යුක්ත දේව පුත්‍රයාණන් බව ප්‍රකාශ කරන ලදහ.

**ක්‍රිස්තුස්වහන්සේගේ ලෙය, දෙවියන් වහන්සේගේ ලෙයයි**

ක්‍රියා 20 : 28

දෙවියන්වහන්සේ විසින් සිය ලෙයින් මිළයට ගත් දේව සභාව පෝෂණය කිරීමට, ශුද්ධාත්මයාණන්, යම් රැළක ඔබලා නායකයන් කර නියම කළසේක්ද, ඒ මුළු රැළ ගැන හා ඔබලා ගැන ප්‍රවේසම්වෙන්න.

එළිදරව් 1 : 5 ආ සහ 8

...යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන්...... මම අල්ෆා සහ ඔමේගාය, පටන්ගැන්ම සහ අවසානයය; සිටින, සිටි, මතු සිටින, සර්වපරාක්‍රමයාණන් යයි ස්වාමින්වහන්සේ කීසේක.

කොලොස්සි 1 : 13 - 16

පියාණන්වහන්සේ, අන්ධකාරයේ බලයෙන් අප මුදා, සිය දයාබර පුත්‍රයාණන්ගේ රාජ්‍යයට අපව කැඳවා ගත්හ. උන්වහන්සේ තුළ අපගේ මිදීම වන, පාප කමාව අපට ඇත. උන්වහන්සේ, අදෘශ්‍යමාන දෙවියන්වහන්සේගේ ස්වරූපයය, මුළු මැවිල්ලේ කුළුඳුලාණෝය; මක්නිසාද සිංහාසන මේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගයේද, පොළොවේද, පෙනෙන දෙය සහ නොපෙනෙන දෙය යන සියල්ල උන්වහන්සේ විසින් මවන ලදහ; සියලුදෙය, උන්වහන්සේ විසින්ද, උන්වහන්සේ උදෙසාද මවා ඇත.

1 තිමොති 6 : 13 - 16

අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රකාශවීම දක්වා, ඔබ මෙම ආඥාව කැලලක් හෝ දෝෂයක් නැතිව පවත්වන ලෙස... ඔබට ආඥා කරමි. ශුභාන්විත, 'එකම අධිපතියාණන් වන, රජුන්ගේ රජ හා ස්වාමින්ගේ ස්වාමියාව සිටින, එකම අමරණීය.. තැනැන්වහන්සේ ඒ ප්‍රකාශවීම නියම කල දී පෙන්වන්නේය උන්වහන්සේට ගෞරවයත්, සදාකාල පරාක්‍රමයත් වේවා. ආමෙන්.

# පියාණන්වහන්සේ හා ක්‍රිස්තුස්වහන්සේද මහෝත්තමය

යොහන් 12 : 45

මා දකින්නා, මා එවූ තැනැන්වහන්සේව දකින්නේය.

හෙබ්‍රෙව් 1 : 3

උන්වහන්සේ, දෙවියන්වහන්සේගේ මහත්තත්වයේ ප්‍රභාවයද, උන්වහන්සේගේ දේවත්වයේ ස්වරූපයද වන්නාහ. සිය බලපරාක්‍රමයේ වචනයෙන් සියල්ල දරමින් පව් ගැන පවිත්‍රවීමක් කළ පසු, උසස් තැන්හි මහෝත්තමයාණන්ගේ දකුණත හිඳගත්සේක.

එපීස 1 : 19 අ-22 අ

අදහන අප කෙරෙහි උන්වහන්සේගේ බලයේ මහත්කම කිමෙක්ද කියා... උන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ තුළ ඉෂ්ට කළ සිය පරාක්‍රමයේ ශක්තියේ ඒ ක්‍රියා කිරීමේ ප්‍රකාරයට ක්‍රිස්තුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටවා, සියලු අධිපතිකමටත්, බලයටත්, පරාක්‍රමයටත්, ස්වාමිකමටත්, මෙලොව පමණක් නොව, මතු ලොව සඳහන් සියලු නම්වලටත් ඉහළින් උසස්කර, ස්වර්ගීය ස්ථානවල සිය දකුණත හිඳුවා, සියලුදෙය උන්වහන්සේගේ පාදවලට යටත් කළසේක...

යොහන් 10 : 30 සහ 38

මමද, පියාණන්ද එක් තැනැත්තෙක්ය.. නුමුත් ඒවා කරත් නම්, ඔබලා මා විශ්වාස නොකරනත්, පියාණන් මා තුළද, මා පියාණන් තුළද සිටින බව, දැන තේරුම් ගන්නා පිණිස ක්‍රියා විශ්වාස කරත්වා.

යොහන් 5 : 27

ඔහු මනුෂ්‍ය පුත්‍රයා බැවින් විනිශ්චය කිරීමටද බලය දුන්සේක.

# ශුද්ධාත්මයාණන්ගේ සර්වබලධාරි බලය

## දේවත්වයේ උන්වහන්සේ සර්වබලධාරීය

ක්‍රියා 5 : 3 - 5

පේත්‍රුස් කථාකර: අනනියස් භූමියේ මිලෙන් කොටසක් තබාගැනීම පිණිස ශුද්ධාත්මයාණන්ට බොරු කීමට සාතන් නුඹේ සිත පිරෙව්වේ මන්ද? එය තිබිය දී, නුඹටම අයිතිව තිබුණා නොවේද? විකුණූ පසුත්, මිල, නුඹේ කැමැත්ත යට තිබුණා නොවේද? නුඹේ සිතින් මෙවැන්නක් යෝජනා කරගැනීමට යෙදුණේ කෙසේද? නුඹ බොරු කීවේ මනුෂ්‍යයන්ට නොව, දෙවියන්වහන්සේටයි කීවේය. අනනියස් එ වචන අසා වැටී මළේය. ඒ ඇසූ සියල්ලන්ට මහත් බියක් පැමිණුනේය.

## අදහන්නන් පුරවා එඩිතරකමදුන්හ

ක්‍රියා 4 : 31

ඔවුන් යාඥා කළ පසු, ඔවුන් රැස් වී සිටි ස්ථානය කම්පා විය; ඔවුහු සියල්ලෝම ශුද්ධාත්මයෙන් පූර්ණව, දේව වචනය නිර්භිත ලෙස කථා කළහ.

## උන්වහන්සේ දිව්‍යමය ආදරය ක්‍රියා කරවති

රෝම 5 : 5

බලාපොරොත්තුව ලැජ්ජාවට නොපමුණුවයි; මක්නිසාද, අපට දුන් ශුද්ධාත්මයානන් විසින් දෙවියන්වහන්සේගේ ආදරය අප හද වගුරවන ලදී.

# දෙවියන්වහන්සේගේ බලපූළුවන්කම

හෙබ්‍රෙව් 7 : 25

එබැවින්, උන්වහන්සේ තුළින් දෙවියන් වහන්සේ වෙත එන්නන් උදෙසා මැදහත්කම් කරන පිණිස උන්වහන්සේ නිරතුරුම ජීවත් වන හෙයින්, කෙළවර තෙක්, ඔවුන්ව ගැලවීමට උන්වහන්සේට පුළුවන.

යූද් 24

ඉතින්, ඔබලා නොපැකිලෙන ලෙස ආරක්ෂා කිරීමටත්, මහත් ප්‍රීතියෙන් යුතුව උන්වහන්සේගේ තේජස ඉදිරියේ කැලැල් රහිතව තැබීමටත් සමර්ථ උන්වහන්සේ...

2 තිමෝති 1 : 12 ආ

...මා අදහන තැනැන්වහන්සේ කවුරුද යත් මා දනිමි. මා උන්වහන්සේට භාර දී තිබෙන දෙය ඒ දවස තෙක්, ආරක්ෂා කිරීමට උන්වහන්සේ පොහොසත් බව මම විශ්වාස කරමි.

2 කොරින්ති 9 : 8

තවද, ඔබලා සියලුදෙයේ දී නිතරම පූර්ණකම ලැබ, සියලු යහපත් ක්‍රියා සඳහා පූර්ණව සිටින පිණිස ඔබලාට සියලු අනුග්‍රහය වැඩි කිරීමට දෙවියන්වහන්සේට පුළුවන.

ලූක් 3 : 8 ආ

...මේ ගල්වලින් ආබ්‍රහම්ට දරුවන් උපදවා දීමට දෙවියන්වහන්සේට පුළුවන.

රෝම 4 : 16 ඇ සහ 19 ආ - 21

...ආබ්‍රහම්... ඇදහිල්ල නැතිකම නිසා චංචල නොවී, එසේය, දෙවියන් වහන්සේගේ පොරොන්දුව දෙස බලා ඇදහිල්ලෙන් බලවත්ව, දෙවියන් වහන්සේට ගෞරවය කරමින්, පොරොන්දු වූ දෙය උන්වහන්සේට ඉෂ්ට කිරීමට හැකි බව නිසැකවම විශ්වාස කළේය.

පිලිප්පි 3 : 21 අ

සියලුදෙය පවා තමා යටට ගැනීමට උන්වහන්සේට පුළුවන.

දනියෙල් 4 : 37

දැන් නෙබූකද්නෙසර් වන මම ස්වර්ගීය රජුට වණ්ඨද, ප්‍රසංසාද, ගෞරවයද, දෙමි; උන්වහන්සේගේ සියලු ක්‍රියා සැබෑය, උන්වහන්සේගේ මාර්ගද ධර්මිෂ්ඨය. උඩඟුකමින් හැසිරෙන්නන් පහත් කිරීමට උන්වහන්සේට පුළුවන.

දනියෙල් 3 : 17 සහ 26 අ, 27 ආ

ඇවිළෙන ගිනි උදුනින් ගැළවීමට, අප සේවය කරන අපේ දෙවියන්වහන්සේට පුළුවන. රජුනි, උන්වහන්සේ අපව ඔබ අතින් ගලවනසේක... එවිට නෙබූකද්නෙසර් ගිනි උදුනේ දෙරකඩට පැමිණ: මහෝත්තම දෙවියන්වහන්සේගේ මෙහෙකරුවන් වන ශෙද්‍රක්, මේෂැක්, ඇබද්නිගෝ, පිටතට එන්නැයි කීවේය... ඒ මනුෂ්‍යයන්ගේ ශරීර කෙරෙහි ගින්න බලපා නොමැති බවත්, ඔවුන්ගේ හිස කෙස් නොදැවුනු බවත් .. ගිනිගඳ ඔවුන්ට වැදිලා නැති බවත්, දිටීහ.

හෙබ්‍රෙව් 2 : 18

මක්නිසාද, උන්වහන්සේම පරික්ෂා කරනු ලැබ, දුක්වින්ද නිසා, පරික්ෂාකරනු ලබන්නන්ට පිහිටවීමට උන්වහන්සේට පුළුවන.

**මරණයට විරුද්ධව බලය**

හෙබ්‍රෙව් 11 : 19 අ

මළවුන්ගෙන් පවා නැගිටවන්ට දෙවියන්වහන්සේට පුළුවනැයි ඔහු කල්පනාකර...

### 2 තිමෝති 3 : 15

ක්‍රිස්තුස් යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල තුළින් ගැළවීම පිණිස ඔබ නැණවත් කිරීමට හැකි ශුද්ධ ලියවිලි, ඔබ බාල වයසේ සිට දැන සිටින බැවින්, ඒවායේ පිහිටා සිටින්න.

### රෝම 14 : 4

අනෙකුගේ මෙහෙකරුවා විනිශ්චය කරන ඔබ කව්ද? ඔහු සිටියත්, වැටුණත්, එය අයිති ඔහුගේම ස්වාමියාටයි. එසේය, ඔහු සිටවනු ලබයි; කුමක් හෙයින්ද, ඔහුව සිටවීමට ස්වාමින්වහන්සේට බලය ඇත.

### එපීස 3 : 20, 21

ඉතින්, අප තුළ ක්‍රියා කරණ බලය හැටියට, අප ඉල්ලන හෝ සිතන සැම දෙයට වඩා, ඉතා අධික ලෙස කිරීමට බලය ඇති තැනැන්වහන්සේටම සියලු පරම්පරාවන් දක්වා සභාවෙහි ක්‍රිස්තුස් වහන්සේ තුළ සදාකාලයටම ගෞරවය වේවා.

### ක්‍රියා 20 : 32

දැන් ඉතින්, දෙවියන්වහන්සේටද, ඔබලව ඉදි කිරීමටත්, පිරිසිදු කළ සියල්ලන් අතරේ ඔබලට උරුමයක් දීමට හැකි උන්වහන්සේගේ අනුග්‍රහයේ වචනයටද ඔබලව භාර කරමි.

### රෝම 11 : 1 සහ 23

එසේ නම්, දෙවියන්වහන්සේ සිය සෙනඟ අත්හළේදැයි අසමි. එසේ නොවේවා. මක්නිසාද, මමත් ආබ්‍රහම්ගේ වංශයේ, බෙන්ජමින්ගේ ගෝත්‍රයේ ඉශ්‍රායෙලයෙක්මි... ඔවුහුද, අවිශ්වාසයේ නොපවති නම්, පාස්සනු ලබති. මක්නිසාද ඔවුන්ව නැවත පාස්සන්ට දෙවියන් වහන්සේට පුළුවන.

ගීතාවලිය 130 : 3, 4

**ස්වාමිනි,** ඔබ අයුතුකම් ගණන්ගන්නේ නම්, අහෝ ස්වාමිනි, කවුරු පවතියිද? නුමුත් ඔබ කෙරෙහි බිය ඇතිව සිටීම පිණිස, ඔබ සමග කමාව ඇත.

2 ලේකම් 7 : 14

මාගේ නාමය දරණ මාගේ සෙනඟ යටත් වී, යාඥාකර මාගේ මුහුණ සොයා, සිය නපුරු මාවත් අත්හරිත් නම් මම ස්වර්ගයේ සිට අසා, ඔවුන්ගේ පව් කමා කර, ඔවුන්ගේ දේසය සුව කරන්නෙමි.

මාර්ක් 2 : 9 – 12

අංසභාග රෝගියාට – ඔබේ පව් කමා කරන ලදි කීමෙනුත්, ඔබේ යහන රැගෙන යන්නැයි කීමෙනුත්, වඩා පහසු කුමක්ද? නුමුත්, පොළෙවේ දී, පව් කමා කිරීමට මනුෂ්‍ය පුත්‍රයාට බලය ඇති බව ඔබලා විසින් දැනගන්නා පිණිසය කියා, උන්වහන්සේ අංසභාග රෝගියාට කථාකර: නැගිට, ඔබේ යහන රැගෙන ගෙදර යන්නැයි ඔබට කියමියි කීසේක. ඔහු එකෙණෙහිම නැගිට, යහන රැගෙන සියල්ලන් ඉදිරියේ පිටත්ව ගියේය. එනිසා සියල්ලෝම විස්මපත් වී... දෙවියන් වහන්සේට ප්‍රසංසා කළහ.

ලූක් 12 : 10

මනුෂ්‍ය පුත්‍රයාට විරුද්ධව වචනයක් හෝ කියන කවරෙකුට නුමුත් කමාව ලැබේ. නුමුත් ශුද්ධාත්මයාණන්ට විරුද්ධව අපහාස කරන්නාට කමාව නොලැබේ.

# ආත්මය සුව කිරීමට ක්‍රිස්තුස්ගේ බලය

2 කොරින්ති 5 : 17

එබැවින්, යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටී නම්, ඔහු අළුත් මැවිල්ලකි. පරණ දෙය පහව ගියේය; මෙන්න, සියල්ල අළුත් වී තිබේ.

යොහන් 11 : 26

ජීවත්ව සිටින කවුරු හෝ මා කෙරෙහි අදහන්නේද, ඔහු කිසි කලෙක නොනසියි. ඔබ මෙය විශ්වාස කරන්නේද?

හෙබ්‍රෙව් 5 : 9 අ 10

උන්වහන්සේව සම්පූර්ණ කරනු ලැබ, තමන් හට කීකරු වන සියල්ලන්ටම සදකාල ගැලවීමේ කර්තෘ වූසේක.

රෝම 5 : 20 ආ

...පාපය මරණයේ රජකම් කළ සේම, අනුග්‍රහය, අප ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළින්, සදකාල ජීවනය සඳහා ධර්මිෂ්ඨකමින් රජකම් කරයි.

2 තිමෝති 1 : 10

මරණය නැති කර, ජීවනයත්, අමරණීය භාවයත් සුභාරංචිය තුළින් එළිදරව් කළ අප ගැලවුම්කරු යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රකාශවීමෙන්, ඒ කරුණාව දැන් ප්‍රකාශ වී තිබේ.

2 කොරින්ති 4 : 11

මක්නිසාද, අප මරණීය මාංසයේ යේසුස්වහන්සේගේ ජීවනය ප්‍රකාශ වන පිණිස, ජීවත් වන අප යේසුස්වහන්සේ උදෙසා නිතරම මරණයට පාවා දෙනු ලැබේ.

යොහන් 10 : 10

සොරා එන්නේ, සොරකම් කිරීමටත්, මැරීමටත්, විනාශ කිරීමටත් පමණක්ය. මා ආවේ, ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධිකව ලැබෙන පිණිසත්ය.

# ශරීරය සුවකිරීමට ක්‍රිස්තුස්ගේ බලය 

ලූක් 5 : 17

එක් දිනක්, උන්වහන්සේ උගන්වන කල, ගලීලයේ හා යුදයේ සියළු ගම්වලින්ද, යෙරුසලමෙන්ද පැමිණි ඵරිසිවරුත්, ව්‍යවස්ථාව උගන්වන්නෝත් එහි හිඳගෙන සිටියහ. සුව කරන පිණිස ස්වාමින්වහන්සේගේ ආනුභාවය උන්වහන්සේ සමග විය.

ලූක් 8 : 43, 44

දෙලොස් වසක් මහ ලේ රෝගයකින් පෙලුනු, සිය සම්පත් වෙදුන්ට වියදම් කළද, කිසිවෙකුගෙන් සුවයක් ලැබීමට බැරි වූ ස්ත්‍රියක්, උන්වහන්සේගේ සළුවේ දරයට අතගැසුවාය. එකණෙහිම ඇයගේ ලේ ධාරාව නැවතුණි.

මාර්ක් 6 : 56

යම්කිසි ගමකට, නුවරකට හෝ ජනපදයකට උන්වහන්සේ ඇතුල් වූවාද, එතැන්හි, ඔවුහු රෝගීන් කඩපිල්වල තබා ඔවුන්ට උන්වහන්සේගේ සළුවේ දරය පමණක් අතගැසීමට ඉඩ දෙන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලූහ. අතගැසූ සියල්ලන්ටම සුවය ලැබිණ.

මතෙව් 8 : 16, 17

සවස් වූ කල යක්ෂාවේශ වූ බොහෝ දෙනෙකුව උන්වහන්සේ වෙත ගෙනෙන ලදහ. උන්වහන්සේ සිය වචනයෙන් ආත්මයන් දුරු කළහ. මෙසේ වූයේ: උන්වහන්සේම අප දුර්වලකම් ගත්සේක, අප රෝග උසුලා ගත්සේකැයි අනාගතවක්තෘ යෙසායා තුළින් කී දෙය සම්පූර්ණ වන පිණිසය.

# සියලුම රෝග සුව කිරීමට බලය

මතෙව් 8 : 3

උන්වහන්සේ සිය අත දිගු කර ඔහු පිට තබා: මම කැමැත්තෙමි; පවිත්‍ර වෙන්නැයි කීසේක. එකෙණෙහිම ඔහු කුෂ්ඨයෙන් පවිත්‍ර විය.

ලූක් 13 : 13

සිය අත් ඈ පිට තැබූසේක. එකෙණෙහිම ඈ කෙළින් වී, දෙවියන්වහන්සේට ප්‍රශංසා කළාය.

ලූක් 7 : 21

ඒ පැයේදී උන්වහන්සේ, බොහෝ දෙනෙකුගේ රෝගද, ව්‍යාධිද සුවකර අශුද්ධාත්ම පහකර, නොයෙක් අන්ධයන්ට පෙනීම දුන්සේක.

ලූක් 17 : 12, 14

උන්වහන්සේ එක්තරා ගමකට ඇතුල් වන කළ, කුෂ්ඨ රෝගීන් දසදෙනෙක් උන්වහන්සේට සම්භවිය... උන්වහන්සේ ඔවුන් දැක: ඔබලා ගොස් පූජකයන්ට පෙනෙන්නැයි කීසේක. ඔවුහු යන අතරම පවිත්‍ර වූහ.

මතෙව් 8 : 14, 15

යේසුස්වහන්සේ පේත්‍රුස්ගේ නිවසට ඇතුල් වූ විට, ඔහුගේ බිරිඳගේ මව උණ රෝගයෙන් ඔත්පළව සිටිනවා දැක, ඇගේ අත ඇල්ලූහ. එවිට උණය ඇගෙන් පහව ගියේය. ඈ නැගිට උන්වහන්සේට උපස්ථාන කළාය.

ලූක් 22 : 50, 51

ඔවුන්ගෙන් එක්තරා කෙනෙකුගේ උත්තම පූජකයාගේ දසයාට ගසා, ඔහුගේ දකුණු කන කපා දැමීය. නුමුත් යේසුස් වහන්සේ... ඔහුගේ කණට අත තබා සුව කළසේක.

# සියලුම රෝග සුව කිරීමට බලය 

මතෙව් 9 : 28 – 30 අ

උන්වහන්සේ නිවසට ආ කළ, ඒ අන්ධයෝ උන්වහන්සේ වෙත ආහ. මෙය මට කිරීමට පුළුවනැයි, ඔබලා විශ්වාස කරත්දැයි යේසුස්වහන්සේ ඔවුන්ගෙන් ඇසූහ. ඔවුහු: එසේය, ස්වාමිනියි කීහ. එවිට උන්වහන්සේ ඔවුන්ගේ ඇස් අත ගා: ඔබලගේ විශ්වාසය අනුව ඔබලට වේවයි කීසේක. එවිට ඔවුන්ගේ ඇස් පැහැදුණේය...

මතෙව් 12 : 13

ඔබේ අත දිගු කරන්නැයි ඒ මනුෂ්‍යාට උන්වහන්සේ කීසේක. ඔහු එය දිගු කළේය; එවිට එය සුව වී, අනිත් අත මෙන් විය.

මතෙව් 8 : 5 – 7 සහ 13

උන්වහන්සේ කපර්ණවුමට ඇතුල් වූ විට, සියයකට මුලාදැනියෙක් උන් වහන්සේ වෙත පැමිණ, උන්වහන්සේට කන්නලව් කරමින්: ස්වාමිනි, මාගේ මෙහෙකරු අංසභාගයෙන් රෝගීව. බලවත් ලෙස වේදනා විඳිමින් නිවසේ ඔත්පළව සිටියි කීය. මම පැමිණ ඔහු සුව කරමියි උන්වහන්සේ ඔහුට කීහ.,. යේසුස්වහන්සේ සියයකට මුලාදැනියාට කථාකර: යන්න, ඔබ අදහාගත් ලෙසම ඔබට වේවයි කීසේක. ඒ පැයේදීම මෙහෙකරු සුව විය.

යොහන් 5 : 5 සහ 8, 9, 10 අ

තිස් අට අවුරුද්දක් දුර්වලව සිටි මනුෂ්‍යයෙක් එහි විය... යේසුස්වහන්සේ: නැගිට, ඔබ යහන රැගෙන යන්නැයි ඔහුට කීහ. එකෙණෙහිම ඒ මනුෂ්‍යයා සුව වී, සිය යහන රැගෙන ගියේය. ඒ දවස සබත් දවස විය.

# 22 යේසුස්ට සුව නොකළ හැකි රෝගයක් නැත

යාකොබ් 5 : 14 අ, 15 අ

ඔබලා අතරේ යමෙක් රෝගීව සිටියිද, ඔහු සභාවේ වැඩිහිටියන් කැඳවත්වා... එවිට ඇදහිල්ලේ යාඥාවෙන් රෝගියාට සුවය ලැබේ. ස්වාමින්වහන්සේ ඔහුව නැගිටුවනසේක...

මතෙව් 4 : 23

තවද, යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින්ද, රාජ්‍යයේ සුභාරංචිය දේශනාකරමින්ද, සෙනඟ අතරේ සියලු ආකාර අසනීප හා සියලු ආකාර රෝග සුව කරමින්ද, මුළු ගලීලයේ ඇවිද්දහ.

ලූක් 6 : 17 ආ – 19

...සිය රෝග සුවකර ගැනීමට... අශුද්ධාත්මයෙන් පීඩිත වූ අය සුව කළහ. උන්වහන්සේගෙන් ආනුභාවය නික්ම වී, ඔවුන් සියල්ලන් සුව කළ බැවින්, මුළු සමූහයා උන්වහන්සේට අතගැසීමට උත්සහ කළහ.

මතෙව් 14 : 36

උන්වහන්සේගේ සළුවේ දරයට අත ගැසීමට ඔවුන්ට ඉඩ දෙන සේ උන් වහන්සේගෙන් ඉල්ලූහ. අතගැසූ සියල්ලෝම සම්පූර්ණයෙන් සුව වූහ.

මතෙව් 15 : 30

බොහෝ සමූහයා කොරුන්, අන්ධයන්, ගොළුවන්, අබ්බගාතයන් හා වෙනත් බොහෝ දෙන රැගෙන යේසුස්වහන්සේ වෙත පැමිණ, උන්වහන්සේගේ පාමුල ඔවුන් තැබූහ. උන්වහන්සේ ඔවුන්ව සුව කළසේක.

මතෙව් 19 : 2

බොහෝ සමූහයා උන්වහන්සේ අනුව ගියහ; උන්වහන්සේ එහි දී ඔවුන්ව සුව කළසේක.

# යක්ෂයන් එළවා හැරීමට ක්‍රිස්තුස්ගේ බලය 

මතෙව් 17 : 18

යේසුස්වහන්සේ ඔහුට තරවටු කළහ; එවිට යක්ෂයා ඔහුගෙන් දුරුව ගියේය. ඒ පැයේදීම ළමයා සුව විය.

ලූක් 4 : 41

යක්ෂයෝද: ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍ර ක්‍රිස්තුස් කියා මහත් හඬනගමින් බොහෝ දෙනෙකුගෙන් දුරු වූහ. උන්-වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බව ඔවුන් දැනගෙන සිටි නිසා, උන්වහන්සේ ඔවුන්ට සැරකරමින් කථා කිරීමට ඉඩ නුදුන්සේක.

මතෙව් 8 : 28 - 32 අ

උන්වහන්සේ එගොඩ වී, ගෙදීරයන්ගේ රටට පැමිණ කළ යක්ෂාවේශ වූ දෙදෙනෙක් සොහොන් ගෙවලින් පිටත්ව එනවා උන්වහන්සේට සම්භවිය. ඔවුන් ඉතා රෞද්‍ර නිසා එමගින් කිසිවෙකුට යෑමට බැරිවිය. බලව, ඔවුහු මොරදෙමින් දේව පුත්‍රයා වන යේසුනි ඔබට අපෙන් කම කිමෙක්ද? කාලයට ප්‍රථමයෙන් අපට වධදීමට ඔබ මෙහි ආයේදැයි කීවෝය. ඔවුන්ට ඈතින් විශාල ඌරු රැළක් ගොදුරු කමින් සිටියහ. යක්ෂයෝද: ඔබ අප දුරු කරත් නම්, ඌරු රැළට වැහෙන්ට අප හැරිය මැනවයි උන්වහන්සේගෙන් ඉල්ලූහ. යත්වා යයි උන්වහන්සේ ඔවුන්ට කීසේක...

මතෙව් 12 : 22

එවිට යක්ෂාවේශ වූ අන්ධ ගොළුවෙක් උන්වහන්සේ වෙත ගෙනෙන ලදී. උන්වහන්සේ ඔහුව සුව කළසේක. එහෙයින් ඒ අන්ධ ගොළුවාට කථා කිරීමටද දැකීමටද හැකි විය.

# මළවුන් නැගිටවීමට ක්‍රිස්තුස්ගේ බලය

ලූක් 7 : 14, 15

උන්වහන්සේ, ළඟට ගොස් දෙනයට අතගැසූහ. එවිට උසුලාගෙන යන්නෝ නැවතුණෝය. උන්වහන්සේ: යෞවනය, ඔබට නැගිටින්න කියමියි කීසේක. එවිට මළා වූ ඔහු නැගිට හිඳ, කථා කිරීමට පටන්ගත්තේය. උන්වහන්සේ, ඔහුගේ මවට ඔහුව භාරදුන්සේක.

යොහන් 11 : 23 - 25 සහ 43, 44

ඔබේ සහෝදරයා නැවත නැගිටින්නේ යයි යේසුස්වහන්සේ ඇයට කීසේක. අන්තිම දින දී, නැවත-නැගිටීමේ දී ඔහු නැවත නැගිටින බව දනිමියි, මාර්තා උන් වහන්සේට කීවාය. නැවත නැගිටීමද, ජීවනයද මමය. මා කෙරෙහි අදහන්නා මළ නමුත් ජීවත් වන්නේය.... උන් වහන්සේ මෙසේ කියා: ලාසරස්, පිටත එන්න, කියා මහත් හඬින් කීසේක. මැරී සිටි තැනැත්තා පිටතට ආවේය; ඔහුගේ අත් පා වස්ත්‍රවලින් බැඳ, මුහුණද රෙදිකඩ කින් ඔතා තිබුණි. ඔහුව මුදහරින්නැයි යේසුස්වහන්සේ ඔවුන්ට කීසේක.

ලූක් 8 : 49 සහ 54, 55 අ

උන්වහන්සේ කථා කරමින් සිටිය දී, සිනගෝගයේ මුළාදෑනියාගේ නිවසින් කෙනෙක් පැමිණ; ඔබේ දුව මැරුණාය; ආචාරීන්ට කරදර නොකරන්නැයි කීය... නුමුත් උන්වහන්සේ ඇගේ අත ගෙන, යෞවනිය, නැගිටින්න කියා ශබ්දනගා කීසේක. එවිට ඇගේ ආත්මය නැවත පැමිණියේය; ඈ එකෙණෙහිම නැගිට්ටාය.

# නැවත නැගිටීමේ දේව පොරොන්දු

යොහන් 5 : 25

සැබවක් සැබවක් ඔබලට කියමි: දෙවියන්වහන්සේගේ පුත්‍රයාගේ හඬ මළවුන්ට ඇසෙන පැය පැමිණෙන්නේය; දැනුත් පැමිණ තිබේ. අසන අය ජීවත් වෙන්නාහ.

යොහන් 6 : 40

මක්නිසාද, මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත නම්, පුත්‍රයාණන් බලා, ඔහු කෙරෙහි අදහන සැමදෙනටම සදාකාල ජීවනය ලැබීමය; මමද, අන්තිම දවස දී, ඔහු නැගිටවන්නෙමීයි කීසේක.

යොහන් 5 : 28, 29 ආ

මෙය ගැන මවිත නොවන්න. මක්නිසාද, සොහොන් ගෙවල සිටින සියල්ලන්ට ඔහුගේ හඬ ඇසෙන පැය පැමිණ... පිටත්ව එති.

ක්‍රියා 24 : 15

ධර්මිෂ්ඨයන්ගේද අධර්මිෂ්ඨයන්ගේද නැවත නැගිටීමක් වන්නේ යයි මොවුන් බලා සිටින සේ, මමද, දෙවියන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තුවෙන් සිටිමි.

2 කොරින්ති 4 : 14

මක්නිසාද, ස්වාමිවූ යේසුස්වහන්සේව නැගිට්ට වූ තැනන්වහන්සේ, යේසුස් වහන්සේ සමග අපවද නැගිටවා, ඔබලා සමග උන්වහන්සේ ඉදිරියෙහි සිටවන බව අපි දනිමුව.

1 තෙසලෝනික 4 : 16

මක්නිසාද, ස්වාමින්වහන්සේම මහත් හඬකින් උත්තම දේව දූතයෙකුගේ හඬද, දෙවියන්වහන්සේගේ හොරණෑ නාදයද ඇතිව ස්වර්ගයෙන් බසිති. ක්‍රිස්තුස් වහන්සේ තුළ මළ අය, පළමුව නැගිටිති.

# ක්‍රිස්තුස්වහන්සේගේ සීමාරහිත බලය

මතෙව් 28 : 18

යේසුස්වහන්සේ පැමිණ ඔවුන්ට කථාකර, ස්වර්ගයේද, පොළොවේද සියලු බලය මට දී තිබේ යයි කීසේක.

රෝම 1 : 20

මක්නිසාද, ලෝකය මැවූ තැන් සිට, දෙවියන්වහන්සේගේ අදෘශ්‍යමාන දෙය වන උන්වහන්සේගේ සදකාලික බලය හා දෙවිකම මවන ලද දෙයින් තේරුම්ගොස් පැහැදිලි ලෙස පෙනෙන්නේය. එබැවින් ඔවුහු නිරුත්තරව සිටිති.

1 පේත්‍රුස් 3 : 22

උන්වහන්සේ ස්වර්ගයට ගොස් දෙවියන්වහන්සේගේ දකුණත සිටිනසේක; දේව දූතයෝද, බලයලත්තෝද, පරාක්‍රමධාරීහුද, උන්වහන්සේට යටත් කරන අය වෙති.

යොහන් 3 : 31

ඉහළින් එන තැනැන්වහන්සේ සියල්ලන්ට වඩා උතුම්ය. භූමියෙන් එන තැනැත්තා භූමිකව, භූමික දෙය කථා කරයි; ස්වර්ගයෙන් එන තැනැන්වහන්සේ සියල්ලන්ට වඩා උතුම්ය.

එළිදරව් 3 : 7 ආ

...ශුද්ධ වූ, සැබෑ වූ, දාවිත්ගේ යතුර ඇත්තා වූ, කිසිවෙක් නොවසන සේ අරින්නා වූ, කිසිවෙක් නාරින ලෙස වසන්නා වූ තැනැන්වහන්සේ මේ කාරණා කියනසේක.

මක්නිසාද, උන්වහන්සේගේ මහිමයෙන් හා ගුණවත්කමින් අප කැඳවාගත් තැනැන්වහන්සේගේ දැනගැනීම තුළින් උන්වහන්සේගේ දිව්‍ය බලයෙන් ජීවිතයටත්, දේවභක්තියටත් අදාල සියලුදෙය අපට දී තිබේ - 2 පේත්‍රුස් 1 : 3

# ක්‍රිස්තුස්වහන්සේගේ සීමාරහිත බලය

## සියලු දෙය දැනගැනීමට

මතෙව් 17 : 27

නුමුත් අප විසින් ඔවුන්ට බාධා නොකරන පිණිස, ඔබ මුහුදට ගොස් බිලී බා, පළමු අසුවන මත්ස්‍යා ගන්න; උගේ කට හැරිය කළ ෂෙකලයක් සම්භවෙයි. එය ගෙන, මා හා ඔබ උදෙසා ඔවුන්ට දෙන්නැයි කීසේක.

යොහන් 2 : 24 ආ, 25 අ

මිනිසා තුළ කුමක් තිබේදැයි දන්නා බැවින් මිනිසා ගැන යමෙකුගේ සාක්ෂිය අවශ්‍යය නොවීය...

රෝම 2 : 12

එබැවින් මාගේ සුභාරංචිය අනුව, දෙවියන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ලවා මනුෂ්‍යයන්ගේ රහස් විනිශ්චය කරන දවස දී...

## ආශ්චර්යය ලෙස 5000 කෑම දීම

මතෙව් 14 : 17 - 21

ඔවුහු: අපට මෙහි තිබෙන්නේ රොටී පහකුත්, මසුන් දෙදෙනෙකුත් පමණයයි උන්වහන්සේට කීහ. ඒවා, මා වෙත මෙහි ගෙනෙන්නැයි උන්වහන්සේ කීසේක. උන්වහන්සේ සමූහයට තණ මත හිඳ ගැනීමට අණකර, රොටී පහත්, මසුන් දෙදෙනත් රැගෙන, ස්වර්ගය දෙස බලා, ආශිර්වාදකර, රොටී කඩා ගෝලයන්ට දුන්සේක. ගෝලයෝද සමූහයාට දුන්හ. සියල්ලෝම අනුභවකර තෘප්තියට පැමිණියෝය. ඔවුහු කැඩු කැබලිවලින් ඉතිරිය එකතුකර පැස් දෙළසක් පුරවා ගත්හ... අනුභව කළ පුරුෂයෝ පමණක් පන්දහසක් පමණ වූහ.

# ක්‍රිස්තුස්වහන්සේගේ සීමාරහිත බලය

### ජලය මත ඇවිදීමට

මතෙව් 14 : 25

රාත්‍රියේ, සතර වන යාමයේ දී, උන් වහන්සේ ඔවුන් වෙත, මුහුද මත ඇවිද ගියසේක.

### සියලු වර්ෂා නැවැත්වීමට

එළිදරව් 11 : 6

සිය අනාගතවාක්‍යයේ දවස දී, වැසි නොවසින සේ අහස වැසීමට, ඔවුන්ට බලය තිබේ. වතුර කෙරෙහි, කැමති විට වතුර ලේ කිරීමටත්, සියලු පීඩාවලින් පොළොවට පහරදීමටත් ඔවුන්ට බලය ඇත.

### කුණාටුව හා මුහුද නිසල කිරීමට

මතෙව් 8 : 26

උන්වහන්සේ: මඳ ඇදහිල්ල ඇත්තෙනි, කුමක් නිසා බිය වන්නේදැයි ඔවුන්ට කියා, නැගිට, සුළඟටත්, මුහුදටත් තරවටු කළසේක; එවිට මහත් නිහඬතාවයක් විය.

### බිත්තියක් තුළින් ඇවිදීමට

යොහන් 20 : 26

අට දිනකට පසු උන්වහන්සේගේ ගෝලයෝ, නැවතත් නිවස තුළ සිටියහ. තෝමස්ද ඔවුන් හා විය. දෙරවල් වසා තිබුණු විට දී යේසුස්වහන්සේ පැමිණ මැද සිට: ඔබලාට සමාදනය වේවා යයි කීසේක.

### පොළොව එක්කර ඉසිලීමට

කොලොස්සි 1 : 16 ආ 17

...සියලුදෙය උන්වහන්සේ විසින්, උන් වහන්සේ උදෙසා මවා තිබේ. උන්වහන්සේ සියල්ලට ප්‍රථමයෙන් සිටිනසේක. සියල්ලද උන්වහන්සේ තුළ පවතින්නේය.

රෝම 6 : 8

තවද මළවුන්ගෙන් නැගිටවනු ලත් ක්‍රිස්තුස්වහන්සේ තවත් නොමැරෙන බවත්, මරණය තවත් උන්වහන්සේ කෙරෙහි බලය නොපවත්වන බවත්, අපි දනිමුව.

රෝම 8 : 11

තවද යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිට වූ තැනැන්වහන්සේගේ ආත්මයාණන් ඔබලා තුළ වාසය කරත් නම්, ක්‍රිස්තුස් යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිට වූ තැනැන්වහන්සේ, ඔබලා තුළ වසන සිය ආත්මයාණන් තුළින් ඔබලගේ මරණීය ශරීරයන්ද ජීවත් කරනසේක.

මම මැරුණෙමි, නුමුත් මම දැන් සදහටම ජීවත්ව සිටිමි... එළිදරව් 1 : 18 අ

ගීතාවලිය 66 : 1 - 4

පොළෝ වැසි සියල්ලෙනි, දෙවියන් වහන්සේට ප්‍රීති නාද පවත්වන්න. උන් වහන්සේගේ මහිමය ගැන ගී කියන්න. උන්වහන්සේගේ ප්‍රසංසාව කීර්තිමත් කරන්න. ඔබගේ ක්‍රියා කොපමණ භයානකද? ඔබගේ බලයේ මහත්කම නිසා ඔබගේ සතුරෝ ඔබට යටත් වෙති. පොළොවේ සියල්ලෝ ඔබට නමස්කාර කරති; ඔබට ගී කියති;ඔබගේ නාමයට ගී කියන්නෝ යයි දෙවියන්වහන්සේට කියන්න.

**උන්වහන්සේගේ රාජයයේ බලය**

1 කොරින්ති 4 : 20

මක්නිසාද, දෙවියන්වහන්සේගේ රාජ්‍යය වචනයෙන් නොව, බලයෙන්ය.

එළිදරව් 17 : 14 අ

මොවුහු බැටළුපැටවාණන්ට විරුද්ධව යුද්ධ කරති, බැටළුපැටවාණෝ ඔවුන්ව පරාජය කරති. මක්නිසාද, උන්වහන්සේ ස්වාමින්ගේ ස්වාමින්ය, රජුන්ගේ රජුය...

# ක්‍රිස්තුස්වහන්සේගේ සීමාරහිත බලය

## සියලු ජීවීන් මත

යොහන් 17 : 2

---ඔබ දුන් සියල්ලන්ට, ඔහු විසින් සදාකාල ජීවිතය දෙන පිණිස, ඔබ සියලු මනුෂ්‍යයන් කෙරෙහි බලය දුන් ලෙස---

## එතුමා මළ විට පොලොවකම්පා ඇති විය

මතෙව් 27 : 50 සහ 51ආ

යේසුස්වහන්සේ නැවතත් මහත් ශබ්දයකින් හඬනගා ආත්මය හළසේක··· පොලොව කම්පා විය.

## එතුමගේ ජීවිතය නැවත නැගිටවීමට

යොහන් 10 : 17, 18

මා විසින් නැවත ගන්නා පිණිස මාගේ ප්‍රාණය දෙන බැවින් මාගේ පියාණන්වහන්සේ මට ප්‍රේම කරනසේක. කිසිවෙක් එය මගෙන් උදුරාගන්නවා නොව, මමම එය දෙමි. එය දීමට මට බලය ඇත, නැවත ගැනීමටද මට බලය ඇත. මේ ආඥාව මගේ පියාණන්වහන්සේගෙන් ලදිමියි කීසේක.

## ස්වර්ගීය තේජස බැබළවීමට

මතෙව් 17 : 2

උන්වහන්සේ ඔවුන් ඉදිරිපිට අන්වෙසක් වූසේක. උන්වහන්සේගේ මුහුණ සූර්‍ය්‍යයා මෙන් බැබලුවේය; උන්වහන්සේගේ වස්ත්‍රද ආලෝකය මෙන් සුදු විය.

## නැවතත් පරාක්‍රමයට හා තේජසටඒමට

මතෙව් 26 : 64

යේසුස්වහන්සේ: මෙතැන්පටන් මනුෂ්‍ය පුත්‍රයා පරාක්‍රමයේ දකුණත වාඩිව හිඳිනවත්, අහසේ වළාකුල් පිට එනවත් ඔබලා දකින්නහුයයි ඔහුට කීසේක.

# ක්‍රිස්තුස්වහන්සේගේ සීමාරහිත බලය 

## පව් කමා කිරීමට

මතෙව් 9 : 6

නුමුත් පොළොවේ දී පව් කමා කිරීමට මනුෂ්‍ය පුත්‍රයාට බලය තිබෙන බව ඔබලා දැනගන්නා පිණිසයි කියා: නැගිට ඔබේ යහන රැගෙන, ඔබේ නිවසට යන්නැයි අංසභාග රෝගියාට කීසේක.

## සදාකාල ජීවනය දීමට

යොහන් 10 : 27, 28 අ

මාගේ බැටළුවෝ මාගේ හඬ අසති, මමද ඔවුන්ව අඳුනමි, ඔවුහු මා පසුපස එති. මම ඔවුන්ට සදාකාල ජීවනය දෙමි…

## ඕනෑම කෙනෙකුව මිදීමට

ලූක් 24 : 47

යෙරුසලමේ සිට සියලු ජාතීන්ට පසුතැවිල්ලද, පව් කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කළ යුතුය.

## ආත්ම පිරිසිදු කිරීමට

1 පේත්‍රුස් 1:2 අ

ආත්මයාණන්ගේ පිරිසිදු කිරීමෙන් කීකරුවීමටත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලෙය ඉසිනු ලැබීමටත්…

## කෙනෙකුව ජයගන්නෙකු කිරීමට

2 තිමෝති 4 : 18 අ

ස්වාමින්වහන්සේ, සියලු නපුරු වැඩින් මා මුදා ආරක්ෂාකර, සිය ස්වර්ග රාජ්‍යයට මා පමුණුවනසේක…

## කෙනෙකුව ඇදහිල්ලේ තැබීමට

1 කොරින්ති 2 : 5

එසේ වූයේ, ඔබලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස, මිනිස් නුවණින් නොපිහිටන පිණිසය.

# ක්‍රිස්තුස්වහන්සේගේ නාමයේ බලය

## පිලිප්පි 2 : 9, 10

එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කර, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක. එසේ කළේ, ස්වර්ගයේද, පොළොවේද, පොළොවේ යට සියල්ලන් යේසුස් යන නාමයට දණ නමන පිණිසය.

## යොහන් 20 : 31

නුමුත් මේවා ලියන ලද්දේ, යේසුස් වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍ර ක්‍රිස්තුස්වහන්සේ බව ඔබලා විශ්වාස කරණ පිණිසත්, උන්වහන්සේගේ නාම-යෙන් ජීවනය ලබන පිණිසත්ය.

## මාර්ක් 9 : 38 ආ, 39

...ආචාරිනි, ඔබගේ නාමයෙන්, කෙනෙකු යක්ෂයන් දුරු කරනවා දිටිමු. ඔහු අප අනුව නොඑන නිසා, අපි ඔහුට තහනම් කළෙමු යයි කීවේය. නුමුත් යේසුස්වහන්සේ කියනසේක්: ඔහුට තහනම් නොකරන්න. මක්නිසාද, මාගේ නාමයෙන් බලවත් ක්‍රියාවක් කරන කිසි වෙකුට, මා ගැන ඉක්මනින් නපුර කථා කිරීමට බැරි වෙයි.

## යොහන් 14 : 13

ඔබලා මාගේ නාමයෙන් ඉල්ලන ඕනෑම දෙයක්...මම ඉෂ්ට කරන්නෙමි.

## ක්‍රියා 3 : 6, 7

පේත්‍රුස්ද: රන් රිදී මට නැත, නුමුත් මට ඇති දෙය ඔබට දෙමි. නාසරීය යේසුස් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න කියා, ඔහුගේ දකුණත අල්ලා, ඔහු නැගිට්ටෙව්වේය. එකෙණෙහිම ඔහුගේ පා හා ඇස්-වට සවි විය.

# ක්‍රිස්තුස්වහන්සේගේ දිව්‍ය ලෙයේ බලය

එපිස 1 : 7

ඒ ආදරවන්තයාණන් තුළ, උන්වහන්සේගේ ලේ තුළින් අප මිදීම වන අප වරදට කමාව අපට ඇත.

ලූක් 22 : 20 ආ

...මෙම කුසලාන ඔබලා උදෙසා වගුරන මාගේ ලෙයේ අළුත් ගිවිසුමය.

එළිදරව් 12 : 11 අ

ඔවුහු, බැටළුපැටවාණන්ගේ ලෙය නිසාද, සිය සාක්ෂියේ වචනය නිසාද, ඔහුගෙන් ජයගත්හ...

හෙබ්‍රෙව් 13 : 20, 21

ඉතින්, සදාකාල ගිවිසුමේ ලෙය තුළින් බැටළුවන්ගේ මහත් එඬේරා වන අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේව, මළවුන්ගෙන් නැවත ගෙනා සමාදානයේ දෙවියන් වහන්සේ, තමන් ඉදිරියේ ප්‍රසන්නව තිබෙන දෙය, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ඔබලා තුළ කරමින් ඔබලා උන්වහන්සේගේ කැමත්ත කරන පිණිස සියලු යහපත් ක්‍රියාවලට ඔබලව සම්පූර්ණ කරන සේක්වා. උන්වහන්සේට සදහටම ගෞරවය වේවා. ආමෙන්.

එළිදරව් 7 : 14 ආ

...මොව්හු මහත් පීඩාව මැදින් ආ අය වෙත්. ඔවුහු සිය සළු බැටළුපැටවාණන්ගේ ලෙයින් සෝද සුදු කරගත්තෝය.

1 යොහන් 1 : 7

නුමුත් උන්වහන්සේ ආලෝකයේ සිටින සේම අපිද ආලෝකයේ හැසිරෙමු නම්, අපට එකිනෙකා සමග පංගුකාරකම ඇත. උන්වහන්සේගේ පුත්‍ර යේසුස්වහන්සේගේ ලෙයද, සියලු පාපයෙන් අපව පවිත්‍ර කරයි.

# උන්වහන්සේගේ බලයට දෙවිතුමට ප්‍රසංසා වේවා!

ඔවුහු කථාකර: මරනු ලද බැටළුපැටවාණෝ, බලයත්, ධනයත්, ප්‍රඥවත්, පරාක්‍රමයත්, ගෞරවයත්, තේජසත්, ප්‍රසංසාවත් ලැබීමට වටිනා තැනැන්වහන්සේයයි මහත් හඬකින් කීහ. එළිදරව් 5 : 12

ගීතාවලිය 102 : 15 සහ 18 ආ

එහෙයින්, ජාතීන් **ස්වාමින්ගේ** නාමයයත්, පොළොවේ සියලු රජවරු ඔබගේ මහිමයටත් භය වෙති... මවනු ලබන සෙනඟක්ද **ස්වාමින්ට** ප්‍රසංසා කරති.

1 පේත්‍රුස් 2 : 9

නුඹුත්, අඳුරෙන් සිය විස්මපත් ආලෝකයට ඔබලා කැඳවාගත් තැනැන්වහන්සේගේ උත්කෘෂ්ටතාවයන් දක්වන පිණිස ඔබලාව තෝරගත් වංශයක්ද, රාජකීය පූජකයෝද, ශුද්ධ ජාතියක්ද, දෙවියන්වහන්සේ සන්තක සෙනඟක්ද වෙති.

ගීතාවලිය 9 : 11

සියොන්හි වාසය කරන්නන් **ස්වාමින්ට** ප්‍රසංසා ගී කීයව්; සෙනඟ අතරේ උන්වහන්සේගේ ක්‍රියා ප්‍රකාශ කරව්.

ගීතාවලිය 22 : 23 අ

**ස්වාමින්ට** බිය ඇත්තෙනි, උන්-වහන්සේට ප්‍රසංසා කරව්...

ගීතාවලිය 67 : 5-7

දෙවියන්වහන්ස, මනුෂ්‍යයෝ ඔබට ප්‍රසංසා කරත්වා; සියලුම මනුෂ්‍යයෝ ඔබට ප්‍රසංසා කරත්වා. එවිට පොළොව සිය අස්වැන්න වර්ධනයකර දෙන්නේය දෙවියන්වහන්සේ, එනම්, අපේම දෙවියන්වහන්සේ අපට ආශිර්වාද කරනසේක. දෙවියන්වහන්සේ අපට ආශිර්වාද කරනසේක; පොළොවේ සියලු සීමාද උන්වහන්සේට බිය වෙති.

# සදාකාල ජීවනය ලැබගැනීමට මා කුමක් කළ යුතුද?



මතෙව් 19 : 16 ආ, 17 ආ-21

...යහපත් ආචාරිනි, සදාකාල ජීවනය ලබාගැනීමට. මා කුමන යහපත් දෙයක් කළ යුතුද...? එවිට උන්වහන්සේ... ඔබ ජීවනයට ඇතුල් වෙන්න කැමති නම් අණවන් පවත්වන්නැයි ඔහුට කීසේක. ඒ කුමන ඒවාදැයි ඔහු උන්වහන්සේගෙන් ඇසීය. යේසුස්වහන්සේ: මිනිනොමරන්න, කාමමිථ්‍යාචාරය නොකරන්න, සොරකම් නොකරන්න, බොරු සාක්ෂි නොදෙන්න, ඔබගේ පියාට, මවට, ගෞරවය කරන්න, ඔබට සේ ඔබ අසල්වැසියාට ආදරය කරන්න යන මේවා යයි කීසේක. යෞවනතාද: මෙම සියල්ල මම ඉෂ්ට කළෙමි, මට යව අඩු මොනවාදැයි උන්වහන්සේගෙන් ඇසීය. යේසුස්වහන්සේද: ඔබ සම්පූර්ණ වීමට කැමති නම්, ගොස්, ඔබ සන්තක දෙය විකුණා දිළිඳුන්ට දෙන්න, එවිට ස්වර්ගයේ දී ඔබට වස්තු ලැබෙන්නේය. ඔබ මා අනුව එන්නැයි ඔහුට කීසේක.

**පසුතැවිලිවෙන්න, විශ්වාස කරන්න, ලැබගන්න**

මාර්ක් 1 :14 ආ, 15

...යේසුස්වහන්සේ .. පැමිණ... කාලය සම්පූර්ණ වී ඇත, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළඟය. පසුතැවිලි වී සුභාරංචිය විශ්වාස කරන්නැයි කීසේක-

යොහන් 1 : 10, 12

එතුමා ලොව සිටිහ; ලොවද එතුමා විසින් සාදන ලදි, නුමුත් ලෝකයා එතුමව ඇඳින ගත්තේ නැත. යම් පමණ දෙනෙක් එතුමව පිළිගත්ද, එනම් එතුමාගේ නාමය කෙරෙහි අදහගත්ද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වීමට එතුමා බලය දුන්හ.

# මාර්ගය, සැබෑව, ජීවනය, ක්‍රිස්තුස්වහන්සේය

යොහන් 1 : 17

ව්‍යවස්ථාව මෝසෙස් තුළින් දෙන ලදි. නුමුත් අනුග්‍රහය හා සැබෑව, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ආයේය.

යොහන් 14 : 6

යේසුස්වහන්සේ ඔහුට කියනසේක්: මාර්ගයද, සැබෑවද, ජීවනයද, මමය. මා තුළින් මිස, කිසිවෙක් පියාණන්වහන්සේ වෙත පැමිණෙන්නේ නැත.

1 යොහන් 2 : 22

යේසුස්වහන්සේ, ක්‍රිස්තුස්වහන්සේ නොවෙයි කියන්නා මිස, බොරුකාරයා වෙන කවුද? පියාණන් සහ පුත්‍රයාණන් එපා කරන්නා, විරුද්ධ ක්‍රිස්තුස්ය.

මතෙව් 7 : 13, 14

පටු දොරටුවෙන් ඇතුල් වෙන්න. මක් නිසාද, විනාශයට යන දොරටුව විශාලය, මාවතද පළලය, එයින් ඇතුල් වන්නන් බොහෝය. ජීවනයට යන දොරටුව පටුය, මාවත අවහිරය; එමනිසා, එය සම්බ වන්නේ සවල්ප දෙනෙකුටය.

යොහන් 1 : 4

උන්වහන්සේ තුළ ජීවනය තිබුණේය; ඒ ජීවනය, මිනිසගේ ආලෝකය විය.

යොහන් 5 : 26

පියාණන්වහන්සේ, තමා තුළම ජීවනය ඇතිව සිටිනා සේ, පුත්‍රයාටත්, තමා තුළම ජීවනය ඇතිව සිටීමට, උන්වහන්සේ වරම් දුන්සේක.

යොහන් 6 : 51 අ

සවර්ගයෙන් බැස ආ ජීවනදායක ආහාරය මමය. යමෙක්, මේ ආහාරයෙන් අනුභව කරයි නම් ඔහු සදකාලිකව ජීවත් වෙයි.

හෙබ්‍රෙව් 9 : 24 - 28

මක්නිසාද, ක්‍රිස්තුස්වහන්සේ... අතින් සෑදූ ශුද්ධස්ථානවලට නොව, අප උදෙසා දෙවියන්වහන්සේගේ අභිමුඛයෙහි දැන් පෙනී සිටින පිණිස ස්වර්ගයට ඇතුල් වූසේක. එහෙත්, උත්තම පූජකයා, අන්‍ය ලෙය රැගෙන, අවුරුදු පතා ශුද්ධස්ථානයට ඇතුල් වන සේ, උන්වහන්සේ බොහෝ වර, තමන්ම ඔප්පු කරණ පිණිස (ඇතුල් වූවා) නොව. එසේ ඇතුල්වීමට නම් ලොව මැවීමේ සිට නොයෙක් වර, උන්වහන්සේ වධවිදීමට තිබුණේය. නුමුත්, තමන්ව පූජා කිරීම තුළින්, පාපය පහ කරන පිණිස, උන්වහන්සේ කාලයාගේ අවසානයේ දී, එක්වරක් ප්‍රකාශ වූහ. තවද එක්වරක් මරණයත්, ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව තිබෙන සේ, බොහෝ දෙනෙකුගේ පාප උසුලන පිස එක්වරක් පූජා වූ ක්‍රිස්තුස්වහන්සේ හා උන්වහන්සේගේ ඊම බලා සිටින්නන් ගැලවීම පිණිස පාපය නොමැතිව දෙවන වර ප්‍රකාශ වනසේක.

### ස්වර්ගයට ගැනීමට එතුමාගේ බලය

ක්‍රියා 4 : 12

වෙන කිසිවෙකු තුළ ගැළවීම නොමැත. මක්නිසාද, මනුෂ්‍යයන් අතරේ, අපේ ගැළවීම පිණිස දෙන ලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත.

### අපායට දැමීමට එතුමාගේ බලය

මතෙව් 10 : 28

ශරීරය නැසීමට හැකි, නුමුත් ආත්මය නැසීමට නුපුළුවන් අයට භය නොවන්න. එහෙත් ආත්මයද, ශරීරයද, නිරයේ විනාශ කිරීමට හැකි තැනැන්වහන්සේට භය වෙන්න.

# අත්‍යාධිකව ගැලවීමට ක්‍රිස්තුස්ගේ බලය

1 තිමෝති 1 : 15

පව්කරුන් ගැලවීමට ක්‍රිස්තුස් යේසුස් වහන්සේ ලොව ආසේක යන කියමන, විශ්වාස වූ, සර්ව ප්‍රකාරයෙන් පිළිගත යුතු කියමනකි; ඔවුන් අතරෙන් මම ප්‍රධානියා වෙමි.

රෝම 1:16

මක්නිසාද, ක්‍රිස්තුස්ගේ සුභාරංචිය ගැන මම ලැජ්ජා නොවෙමි; අදහන සැමට එය දෙවියන්හවන්සේගේ බලයව තිබේ.

නුමුත්, මා දෙන වතුරෙන් බොන කව රෙකු හෝ කිසි කලෙක පිපාසය නොවේ; මා ඔහුට දෙන වතුර, ඔහු තුළ සදකාල ජීවනය නික්මවන වතුර උල්පතක් වන්නේය. යොහන් 4 : 14.

රෝම 3 : 24, 25 අ

එබැවින් ඔවුහු, උන්වහන්සේගේ අනුග්‍රහයෙන්, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ ඇති මිදීම තුළින්, නොමිළයේ ධර්මිෂ්ඨ කරන්නෝ වෙති. ඇදහීම තුළින්, සිය ලෙයින් උන්වහන්සේ පව් නසන පූජාවක් වීමට දෙවියන්වහන්සේ නියම කළසේක..

2 පේත්‍රුස් 1 : 10

ඔබලගේ කැඳවීමද, තෝරාගැනීමද ස්ථිර කරගැනීමට, වඩා කඩිසරව ක්‍රියා කරන්න. මක්නිසාද, ඔබලා මෙම දෙය කරත් නම්, කිසි කලෙක පැකිලෙන්නේ නැත.

ලූක් 10 : 19

බලව...සතුරාගේ මුළු ශක්තිය මැඩ-ලීමට මම ඔබට බලය දෙමි.

**මීට වඩා මිළයක් ගෙවීමට දෙවියන් වහන්සේට නැත**

යොහන් 3 : 16

මක්නිසාද, දෙවියන්වහන්සේ **ස්වකීය** ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ආදරය කළසේක. එසේ කළේ, උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදකාල ජීවනය ලබන පිණිසය.

**අහෝ, මිනිසාට ගැලවීම ගෙනා කරුණාව. සියලු මැවීම්වල ස්වාමින් අප සියල්ලන් උදෙසා මළේය!**

ලූක් 23 : 34 ආ සහ 46

එවිට යේසුස්වහන්සේ කථාකර: පියාණෙනි, ඔවුන්ට කමාවුව මැනව. මක් නිසාද, ඔවුන් කුමක් කරන්නේද කියා ඔවුහු නොදනිතියි කීසේක... යේසුස් වහන්සේ මහත් හඬකින් මොරගසා: පියාණෙනි, ඔබගේ දෑතට මා ආමත්‍ය භාර දෙමියි කීසේක. මෙසේ කියා උන් වහන්සේ ආත්මය හළසේක.

**අපට නොමිළයේ ගැනීමටය**

එළිදරව් 22 : 17

ආත්මයාණන්ද, මනාලයාද, එන්න කියති. අසන්නාද: එන්න කියන්න. පිපාසය ඇත්තාද එන්න. කැමති කෙනෙක් ජීවන-වතුර නොමිළයේ ගන්න.

**පියාණන් සිය පුත්‍රයාට ආදරේ සේම, මිදීම ලත් මනාලියටද ආදරේය- මීට වඩා උතුම් ආදරයක් තවත් නැත!**

යොහන් 17 : 23

මෙසේ කළේ, මා ඔවුන් තුළද, ඔබ මා තුළද සිටීමෙන්, ඔවුන් ඒකත්වයකට **සම්පූර්ණ** ලෙස පැමිණෙන පිණිසත්, ඔබ මා **එවූ බවද, මට ආදරය කළ සේම, ඔවුන්ටද ආදරය** කළ **බවද** ලෝකයා දැනගන්නා පිණිසත්ය.

# යේසුස් ක්‍රිස්තුස් සමිඳුට දැන්ම සම්පූර්ණයෙන් කැපවෙන්න

**ඔබ පව් කියා දී පසුතැවිලි වෙන්න**

1 යොහන් 1 : 9

අපේ පව් අපට කමා කිරීමටත්, සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කිරීමටත්, උන්වහන්සේ විශ්වාසව, ධර්මිෂ්ඨව සිටිනසේක.

ක්‍රියා 3 : 20 ආ

...ඔබලගේ පාප මකා දැමීම පිණිස පසුතැවිලි වී හැරෙන්න.

**දේව පුත්‍රයා කෙරෙහි අදහන්න**

1 යොහන් 5 : 11, 12

ඒ සාක්ෂිය නම්, දෙවියන්වහන්සේ අපට සදකාල ජීවනය දුන් බවය. ඒ ජීවන යද සිය පුත්‍රයාණන් තුළ තිබේ. පුත්‍රයාණන් ඇත්තාට ඒ ජීවනය ඇත; දෙවියන් වහන්සේගේ පුත්‍රයා නැත්තාට ඒ ජීවනය නැත.

යොහන් 3 : 36

පුත්‍රයාණන් කෙරෙහි අදහන්නාට සදකාල ජීවනය ඇත; නුමුත් පුත්‍රයාණන්ට කීකරු නොවන්නා, ජීවනය නොදකින්නේය, නුමුත් දේව උදහස ඔහු කෙරෙහි පවතියි.

රෝම 6 : 16

ඔබලා, කීකරුකම පිණිස දසයන් ලෙස යමකට ඔබලම භාර වන්නේද, එය මරණයට පමුණු වන පාපය වේවා, ධර්මිෂ්ඨකමට පමුණු වන කීකරුකම වේවා, ඔබලා කීකරු වන දෙයට දසයන් වන බව නොදනිත්ද?

රෝම 6 : 13

ඔබලගේ අවයවයන්, අධර්මිෂ්ඨකමේ ආයුධ කර පාපයට භාර නොදී... දෙවියන් වහන්සේට භාර වෙන්න.

# සැබෑ ඇදහිලිවතුන් තුළ දේව බලය

### බය වෙනුවට ආදරය

2 තිමෝති 1 : 7

දෙවියන්වහන්සේ අපට බයාදුකමේ ආත්මයක් දී නැත. නුමුත් බලයේත්, ආදරයේත් හික්මවීමේත්ය.

1 යොහන් 4 : 18

ආදරයේ බය ඇත්තේ නැත. සම්පූර්ණ අ දරය බය දුරුකරයි. මක්නිසාද, බය පීඩාවෙන් යුක්තය; බය තැනැත්තා ආදරයේ සම්පූර්ණ නොවී සිටියි.

### වෛරය වෙනුවට ආදරය

1 යොහන් 4 : 20, 21

යමෙක්, දෙවියන්වහන්සේට ආදරය කරමියි කියා, සිය සහෝදරයාට වෛර කරයි නම්, ඔහු බොරුකාරයෙකි. මක්නිසාද, තමා දුටු සහෝදරයාට ආදරය නොකරයි නම, නුදුටු දෙවියන්වහන්සේට ආදරය කිරීමට හැකි වන්නේ කෙසේද? දෙවියන් වහන්සේට ආදරය කරන තැනැත්තා, සිය සහෝදරයටත් ආදරය කරත්වා යන මේ ආඥාව අපි උන්වහන්සේගෙන් ලැබීමුව.

ගලාති 5 : 22, 23

නුමුත්, ආත්මයාණන්ගේ ඵල නම්: ආදරය, ප්‍රීතිය, සාමය, ඉවසීම, කරුණාව යහපත, විශ්වාසය, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම යන මේවාය. මෙබඳු දෙයට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත.

### සැකය වෙනුවට ඇදහීම

රෝම 8 : 35, 37

ක්‍රිස්තුස්වහන්සේගේ ආදරයෙන් අප වෙන් කරන්නේ කවුද? විපතවත්, සිත් වේදනාවවත්, පීඩාවවත්, දුර්භික්ෂයවත්, නිර්වස්ත්‍රකමවත්, උපද්‍රවයවත්, කඩුවත්, අප වෙන් කරයිද?... අපට ආදරය කළ තැනැන්වහන්සේ තුළින්, මේ සියල්ලේ දී අපි, අතිශයින් ජයගත්තෝ වෙමුව.

**ආදරනීය සැළකුම්, පාළුවක් නැත**

හෙබ්‍රෙව් 13 : 5

ඔබලාට ඇති දෙයින් සතුටු වී, වස්තු තෘෂ්ණාවෙන් තොරව සිටින්න. මක්නිසාද: මම කිසිසේත් ඔබෙන් අහක්ව නොයමි; කිසිසේත් ඔබව අත්නාරිමියි උන්වහන්සේ කියා තිබේ.

**පීඩාව වෙනුවට සාමය**

ඔබලා වෙත සාමය තබා යමි; මාගේ සාමය ඔබලට දෙමි. මා දෙන්නේ ලෝකයා දෙන්නාක් සේ නොව, ඔබලගේ සිත් කැළඹීමටවත්, බයවීමටවත් නොදෙන්න. යොහන් 14 : 27

රෝම 8 : 6

මාංසයේ ඇල්ම මරණයයි; නුමුත් ආත්මයේ ඇල්ම, ජීවනය හා සාමයයි.

රෝම 5 : 1

එබැවින්, ඇදහිල්ලෙන් අපව ධර්මිෂ්ඨ කරනු ලැබ, අපේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළින්, දෙවියන්වහන්සේ සමග අපට සාමය ඇත.

**සැබෑ වස්තුන්, තණ්හාව නැත**

ලූක් 12 : 15

උන්වහන්සේ කථාකර: සියලු ආකාර ලෝභකමින් ප්‍රවේසම් වෙන්න. මක්නිසාද මිනිසෙකුට කොපමණ දේපළ තිබුණද, ඔහුගේ ජීවිතය එහි පිහිටා නැතැයි, ඔවුන්ට කීසේක.

යාකොබ් 2 : 5

මාගේ ආදරණීය සහෝදරයෙනි, අසන්න; ඇදහිල්ලෙ ධනවත් වන පිණිස හා තමන්වහන්සේට ආදරය කරන්නන්ට පොරොන්දු වූ රාජ්‍යයේ උරුමක්කාරයන් වන පිණිස, දෙවියන්වහන්සේ, ලෝකයේ දිළින්දන් තෝරා නොගත්සේක්ද?

# සැබෑ ඇදහිලිවතුන් තුළ දේව බලය

## ස්ථිරත්වය, අස්ථිරයත්වය නොව

1 යොහන් 5 : 13

දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ නාමය කෙරෙහි අදහන ඔබලට මා මේ දෙය ලියා එවුයේ, ඔබලාට සදකාල ජීව නය ඇති බව, ඔබලා දැනගන්නා පිණිසය.

## දුරාචාරය වෙනුවට පිරිසිදුකම

1 පේත්‍රුස් 1 : 22

සහෝදරයන්ට අවංකව ආදරය කරන පිණිස සත්‍යතාවයට කීකරුව ඔබලගේ ආත්ම පිරිසිදු කරගත් නිසා සිතින් උනන් දුව, එකිනෙකාට ආදරය කරන්න.

1 තිමෝති 1 : 5

ආඥවේ අභිප්‍රාය නම්, පිරිසිදු සිතකිනුත් යහපත් හෘදයසාක්ෂියකිනුත්, සැබෑ අවංක ඇදහීමෙනුත් නික්මෙන ආදරයයි.

## දුක් වෙනුවට දිව්‍ය ප්‍රීතිය

රෝම 15 : 13 ආ

බලාපොරොත්තුවේ දෙවියන්වහන්සේ, ඇදහිල්ලේ සියලු ප්‍රීතියෙන්ද, සාමයෙන්ද, ඔබලව පූර්ණ කරනසේක්වා.

යොහන් 15 : 11

මාගේ ප්‍රීතිය ඔබලා තුළ පවතින පිණි-සද, ඔබලගේ ප්‍රීතිය සම්පූර්ණ වන පිණිසද, මෙම දෙය ඔබලට කීවෙමි.

යොහන් 16 : 22

එසේ දැන් ඔබලට දුක ඇත. නුමුත්, නැවත ඔබලා දකින්නෙමි. එවිට ඔබලගේ සිත ප්‍රීති වන්නේය. ඔබලගේ ප්‍රීතිය, කිසිවෙක් ඔබලගෙන් පැහැර නොගන්නේය.

# සැබෑ ඇදහිලිතුවන් තුළ දේව බලය

**දුර්වලකම වෙනුවට ශක්තිය**

එපීස 6 : 10

ඉතින්, ස්වාමින් තුළද, උන්වහන්සේගේ ශක්තියේ බලයේද බලවත් වෙන්න.

**සර්වාශුභවාද වෙනුවට බලාපොරොත්තුව** (සර්වාශුභවාදය නම්, සියල්ලේම අසුභ පක්ෂය දක්නා බව)

තීතස් 2 : 12 ආ

...ආශිර්වාදලත් බලාපොරොත්තුව ගැනත්, මහෝත්තම දෙවියන්වහන්සේ වන අප ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේද තේජසේ ප්‍රකාශවීම ගැනත් බලා සිටිමින්...

හෙබ්‍රෙව් 6 : 18, 19

මෙසේ කළේ, දෙවියන්වහන්සේ විසින් බොරුකීමට නොහැකි, වෙනස් නොවන කාරණා දෙකක් නිසා, අප ඉදිරියේ තබා ඇති බලාපොරොත්තුව අල්ලාගැනීමට ආරක්ෂාව පිණිස පලා ආ අපට මහත් ධෛර්යයක් ලැබෙන පිණිසය. ඒ බලාපොරොත්තුව ආත්මයේ සත්තක, ස්ථිර, තිරයෙන් ඇතුළට යන නැංගුරමක් සේ අපට ඇත.

**වංචාව වෙනුවට යහපත**

1 පේත්‍රුස් 2 : 12

ඔබලා නපුර කරන්නෝ යයි, අන්‍ය ජාතීන් ඔබලාට විරුද්ධව කථා කරන නුමුත්, ඔවුන් ඔබලාගේ යහපත් ක්‍රියා දැක විභාගකරන දින දී දෙවියන්වහන්සේට ගෞරවකරන පිණිස, ඔවුන් අතර ඔබලාගේ හැසිරීම ඔබන ලෙස පවත්වන්න.

**බොරුකීම වෙනුවට සැබෑව**

යොහන් 8 : 32

ඔබලා සැබෑව දැනගන්නේය; සැබෑව ඔබලාව නිදහස් කරන්නේය.

**පරාජය වෙනුවට ජය**

1 යොහන් 5 : 4

මක්නිසාද, දෙවියන්වහන්සේගෙන් උපන් යමක් ඇද්ද, එය ලෝකයෙන් ජය ගනියි. ලෝකයෙන් ජයගන්නා ජය නම් අප ඇදහිල්ලය.

එළිදරව් 15 : 2

ගින්නෙන් මිශ්‍ර වීදුරු සාගරයක්... සහ මෘගයාගෙන්ද, ඔහුගේ රූපයෙන්ද, ඔහුගේ නමේ ගණනෙන්ද ජයගෙන එන්නන් දෙවියන්වහන්සේගේ වීණා රැගෙන වීදුරු සාගරය ළඟ සිටිනවා මම දිටිමි.

**ළදරුකම වෙනුවට වර්ධනය**

හෙබ්‍රෙව් 6 : 1 අ, 2

එනිසා, මළ ක්‍රියා ගැන පසුතැවිලි වීමද, දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහීමද, නැමති අත්තිවාරමක් නැවත නොතබා, ක්‍රිස්තුස්වහන්සේගේ මුල් කාරණා පසුකර සම්පූර්ණවීමට පැමිණෙමු.

1 පේත්‍රුස් 2 : 3

පිරිසිදු වචනය නැමති කිරිවලින් ඔබලා වර්ධනය වන පිණිස, අලුත උපන් බිළිඳුන් මෙන්, එයට බෙහෙවින් ප්‍රිය කරන්න.

එපීස 4 : 15

ආදරයෙන් යුතුව, සත්‍යය කථා කරමින් හිසව සිටින ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලුදෙයෙහි වර්ධනය වීම පිණිසය.

**ක්‍රිස්තුස්වහන්සේ මෙන් බව ඇති කරයි**

1 යොහන් 2 : 6

උන්වහන්සේ තුළ පවතිමියි කියන තැනැත්තා, උන්වහන්සේ හැසුරුණා සේ හැසිරිය යුතුය.

# සැබෑ ඇදහිලිවතුන් තුළ දේව බලය

## ඇතුළත මිනිසා තුළ ශක්තිය

එපීස 3 : 16, 19 ආ

උන්වහන්සේගේ ආත්මයාණන් විසින් ඔබලගේ අභ්‍යන්තර මිනිසා තුළ ඔබලා බලයෙන් ශක්තිමත් වන පිණිස, උත් වහන්සේගේ මහිමයේ සම්පතේ සැටියට ඔබලට දෙන මෙන් යාඥා කරමි.

පිලිප්පි 4 : 13

මා බලවත් කරන ක්‍රිස්තුස්වහන්සේ තුළ මට සියල්ල කළ හැකිය.

## මිනිස් ඥානය මත රඳා නොපවතියි

1 කොරින්ති 2 : 4

මාගේ කථාවත්, මාගේ දේශනාවත්, නෛස් ඥානයෙන් පොළඹවන වචනයෙන් ඉනාව, ආත්මයාණන්ගේද, බලයේද ම ද්‍රිාශ කිරීමෙන්ය.

## සාක්ෂිදරීමට බලය

ක්‍රියා 1 : 8

නුමුත් ශුද්ධාත්මයාණන් ඔබලා කෙරෙහි පැමිණි කළ, ඔබලා බලය ලබති එවිට ඔබලා යෙරුසලමේද... පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකරුවන් වන්නෝය.

ක්‍රියා 5 : 32

අපි මේ කාරණාවල සාක්ෂිකරුන්ය. එසේම, තමන්ට කීකරුවෙන්නන් හට දෙවියන්වහන්සේ දුන් ශුද්ධාත්මයද සාක්ෂිකරුවෙකි.

ක්‍රියා 4 : 33

ස්වාමිවූ යේසුස්වහන්සේගේ නැවත නැගිටීම ගැන, ගොලයෝ මහත් බල-යෙන් සාක්ෂි දුන්හ. මහත් අනුග්‍රහයක් ඔවුන් සියල්ලන් මත විය.

යොහන් 17 : 15

ඔබ, ලොවින් ඔවුන්ව ගන්නා පිණිස නොව, නපුරාගෙන් ඔවුන්ව ආරක්ෂා කරන පිණිස යාඥා කරමි.

පිලිප්පි 4 : 7

සියලු නැණනුවණ අභිමවා යන දෙවියන් වහන්සේගේ සමාදනය ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ ඔබලගේ සිත්ද, සිතුවිලිද ආරක්ෂා කරයි.

ලූක් 10 : 18, 19

උන්වහන්සේ ඔවුන්ට කියනසේක: සාතන් විදුලිය සේ අහසෙන් වැටුනා දිටිමි. බලව, සර්පයන්ද, ගෝනුස්සන්ද පැගිමටත් සතුරාගේ මුළු ශක්තිය මැඩ පැවැත්වීමටත් මා ඔබලට බලය දී තිබේ. කිසිවකින් හෝ ඔබලාට අනතුරක් සිදුනොවෙයි.

එළිදරව් 3 : 10

මාගේ ඉවසීමේ වචනය ඔබ රක්ෂා කළ නිසා, පොළාවේ වසන්නන් පරික්ෂා කිරීමට, මුළු ලොව මත පැමිණිමට ඇති පරික්ෂාවේ පැයෙන් මමත් ඔබව ආරක්ෂා කරමි.

එළිදරව් 2 : 26

ජයගන්නාවූ, කෙළවර දක්වා මාගේ ක්‍රියා පවත්වන්නාවූ තැනැත්තාට, මාගේ පියාණන්ගෙන් මා ලත් ලෙස ජාතීන් කෙරෙහි බලය දෙමි.

එපීස 6 : 10, 11

ඉතින්, ස්වාමීන් තුළද, උන්වහන්සේගේ ශක්තියේ තුළද, බලවත්කමෙහිද බලවත් වෙන්න. යක්ෂයාගේ උපායන්ට විරුද්ධව සිටීමට ඔබලට හැකි වන ලෙස දෙවියන් වහන්සේගේ සියලු යුඩායුධ පැළඳගන්න.

**ඇදහීම තුළින් අපට. අපගේ සීමාරහිත දෙවිඳුට පමණක් පුණී කිරීමට පුළුවන**

මතෙව් 21 : 22

ඔබලා ඇදහීම තුළ යාඥවෙන් ඉල්ලන සියලුදෙය ඔබලට ලැබේ...

යොහන් 15 : 7, 8

ඔබලා මා තුළ පවතී නම් මාගේ වචනය ඔබලා තුළ පවතී නම්, ඔබලා කැමති දෙයක් ඉල්ලන්න. එය ඔබලට ඉෂ්ට කරනු ලැබේ. මාගේ පියාණන්ට ගෞරවය ලැබෙන්නේ, ඔබලා බොහෝ එල දරීමෙන්ය; මෙසේ ඔබලා මාගේ ගෝළයෝ වන්නෝය.

1 යොහන් 5 : 14, 15

උන්වහන්සේ ඉදිරියෙහි අපට ඇති විශ්වාසය නම්, අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලූ විට, උන් වහන්සේ අපේ ඉල්ලීම අසන බවය. අප යම් දෙයක් ඉල්ලන කළ, උන්වහන්සේ අසන බව අපි දනිමු නම්, අප උන්වහන්සේගෙන් ඉල්ලූ දෙය අපට ලැබෙන බව දනිමුව.

මතෙව් 7 : 7, 8

ඉල්ලන්න, එවිට ඔබලට දෙනු ලැබේ; සොයන්න, එවිට ඔබලට සම්භවේ; තට්ටු කරන්න, එවිට ඔබලට දෙර හරිනු ලැබේ. මක්නිසාද, ඉල්ලන සියල්ලන්ටම ලැබේ; සොයන්නාට සම්භවේ; තට්ටුකරන්නාට දෙර හරිනු ලැබේ.

යොහන් 14 : 12 - 14

සැබවක්, සැබවක් ඔබලට කියමි, මා කෙරෙහි අදහන්නා මා කරන ක්‍රියාද කරන්නේය; මා පියාණන් වෙත යන නිසා, මීට වඩා මහත් ක්‍රියා ඔහු කරන්නේය. මාගේ නාමයෙන්, ඔබලා ඉල්ලන කුමන දෙයක් වුවත්, පුත්‍රයා තුළ

පියාණන්වහන්සේ ගෞරවය ලබන පිණිස මම එය ඉෂ්ට කරමි. මාගේ නාමයෙන්, ඔබලා ඉල්ලන ඕනෑම දෙයක් වුවත්, මම එය ඉෂ්ට කරමි.

මාර්ක් 11 : 24

එබැවින් ඔබලට කියමි, ඔබලා යාඥ වෙන් ඉල්ලන කුමන දෙයක් වුවත්, ඒ සියල්ල ඔබලට ලැබුණු බව විශ්වාස කරන්න; ඒවා ඔබලට ලැබෙන්නේය.

ගීතාවලිය 37 : 4, 5

**ස්වාමින්** කෙරෙහි එබ ප්‍රිති වෙන්න; උන්වහන්සේ, ඔබ සිතෙහි ආසාවන් ඉෂ්ට කරනසේක. ඔබගේ මාර්ගය **ස්වාමින්ට** භාරදෙන්න; උන්වහන්සේ කෙරෙහි විශ්වාසද කරන්න, උන්වහන්සේ එය ඉෂ්ට කරනසේක.

ලූක් 17 : 6

**ස්වාමින්වහන්සේ** කියනසේක්: අබ ඇටයක ප්‍රමාණයක ඇඳහිල්ලක් ඔබලට ඇත්නම්, මේ අඹිල්ල ගසට කථාකර: මුලින් ඔබ ඉදිරි, මුහුදේ පැලවෙව්, කී විට එය ඔබලට කීකරු වෙයි.

පිලිප්පි 4 : 19

මාගේ දෙවියන්වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ තුළ, තමන්ගේ තේජසේ සම්පත් ප්‍රකාරයට ඔබලගේ සියලු හිඟකම් සම්පූර්ණ කරනසේක.

1 යොහන් 3 : 21, 22

ආදරවන්තයෙනි, අප සිත් අපට දෝෂාරෝපණය නොකරත් නම්, දෙවියන් වහන්සේ ඉදිරියෙහි නිර්භීතකම අපට ඇත; තවද, අප උන්වහන්සේගේ ආඥා පවත්වමින්, උන්වහන්සේ ඉදිරියෙහි ප්‍රසන්න දෙය කරන බැවින්, අප උන් වහන්සේගෙන් ඉල්ලන සියල්ල ලබමුව.

මාර්ක් 9 : 23

යේසුස්වහන්සේ උත්තර දෙමින්: ඔබට විශ්වාශ කිරීමට පුළුවන් නම්, විශ්වාස කරන්නාට සියල්ල පුළුවනැයි කීසේක.

Published in numerous languages by World Missionary Press, Inc. as God supplies funds in answer to prayer. If you would like more copies for prayerful distribution, specify which language(s) you need and how many booklets.

Distributed free of charge by:

**Every Home Crusade, 6 Park Place, Colombo**

Cover photo STSci-PRC2003-11a of Helix Nebula courtesy of NASA and STSci

Read booklets online or by App
www.wmp-readonline.org

www.wmpress.org 9-17 729 Sinhala POG